2020

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT



පොල් පර්යේෂණ ආයතනය

தென்னை ஆராய்ச்சி நிறுவனம்

COCONUT RESEARCH INSTITUTE

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය

தென்னை, கித்துல் மற்றும் பனைச் செய்கை மேம்பாடு மற்றும் அவை சார்ந்த கைத்தொழில் பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சு

STATE MINISTRY OF COCONUT, KITHUL AND PALMYRAH CULTIVATION PROMOTION AND RELATED INDUSTRIAL PRODUCT MANUFACTURING & EXPORT DIVERSIFICATION

වැවිලි අමාත්‍යාංශය

பெருந்தோட்ட அமைச்சு

Ministry of Plantation

පටුන

- දැක්ම, මෙහෙවර සහ කාර්ය භාරය 03
- ආයතනික ව්‍යුහය 04
- පොල් පර්යේෂණ ආයතනය 05 - 06
- සභාපතිතුමාගේ පණිවිඩය 07 - 08
- අධ්‍යක්ෂකතුමියගේ පණිවිඩය 09 - 10
- පර්යේෂණ නිර්දේශ 11 - 14
- ප්‍රථිපත්ති යෝජනා 15 - 18
- පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ 19 - 56
  - ➢ පොල් ප්‍රභේද වැඩි දියුණු කිරීම 21 - 25
  - ➢ පොල් නිෂ්පාදන තාක්ෂණය 26 - 29
  - ➢ පොල් වගාව කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම 30 - 34
  - ➢ වගා සංරක්ෂණය 35 - 40
  - ➢ පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම 41 - 49
  - ➢ සමාජ ආර්ථික පර්යේෂණ 50 - 56
- පර්යේෂණ සංවර්ධනයන් 57 - 62
- තාක්ෂණ හුවමාරු කටයුතු 63 - 70
- පාර්ශවකරුවන් වෙත ලබාදෙන සේවා තුළින් ජාතික සංවර්ධනයට ලබා දෙන දායකත්වය 71 - 80

- ජාතික සහයෝගිතා වැඩසටහන 81 - 84
- වතු කළමනාකරණ කටයුතු 85 - 124
- කාර්ය මණ්ඩලය 125 - 152
  - ➢ පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය 127 - 142
  - ➢ බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම්, උසස් වීම් හා ස්ථාන මාරු 143 - 150
  - ➢ කාර්ය මණ්ඩල ජයග්‍රහණ 451 - 452
  - ➢ අධ්‍යයන හා වෘත්තීමය ජයග්‍රහණ 453 - 458
  - ➢ දේශීය සහ ජාත්‍යන්තර ප්‍රකාශන 459 - 466
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 467 - 492
- විගණන වාර්තාව 493 - 502

සභාපති සහ භාණ්ඩාගාරය
නියෝජිත



අපගේ දැක්ම

පොල් සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ තාක්ෂණ ජනනය කිරීම සහ තාක්ෂණ ප්‍රවර්ධනය කිරීමෙහිලා කලාපයේ ප්‍රමුඛයා බවට පත්වීම

අපගේ මෙහෙවර

පොල් කර්මාන්තයේ තිරසාර දියුණුව සඳහා අවශ්‍ය වන තාක්ෂණ දැනුම පර්යේෂණ කටයුතු මඟින් බිහිකිරීම

අපගේ කාර්යභාරය

1. පොල් ගසේ වැඩීම, පොල් වගාවල අනෙකුත් බෝග වගාවන් සහ සත්ත්ව පාලන කටයුතු, පළිබෝධ සහ රෝග පාලනය කිරීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.
2. පොල් සැකසීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අගය එක්කළ නිෂ්පාදන පිළිබඳව තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.
3. ආයතනයේ බීජ පොල් උයන් සහ පර්යේෂණ මධ්‍යස්ථාන අලුතින් ඇති කිරීම සහ පවත්වාගෙන යාම.
4. පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා උපදේශක සහ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම.
5. පොල් කර්මාන්තය තුළ ඇති සියළුම තාක්ෂණ කාර්යාවලීන් සඳහා තාක්ෂණික අංශවලින් ලබාදිය යුතු මඟපෙන්වීම සහ උපදේශකත්වය ලබාදීම.

ආයතනික ව්‍යුහය


සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය
අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ කළමණාකරු(වතු)
අභ්‍යන්තර විගණක
සංස්ථාපන ඒකකය
ගිණුම් ඒකකය
වතු කළමනාකරණ අංශය
අභ්‍යන්තර විගණන ඒකකය
ඉංජිනේරු ඒකකය
ශස්‍ය විද්‍යා
කෘෂි ආර්ථික හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ
පොල් සැකසුම්
වගා සංරක්ෂණ
ප්‍රවේණි හා ශාක අභිජනන
ශාක කායික විද්‍යා
පාංශු හා ශාක පෝෂණ
පටක රෝපණ
තාක්ෂණ හුවමාරු
පුස්තකාල සේවා

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

පොල් පර්යේෂණ ආයතනය
වාර්ෂික වාර්තාව - 2020

1928 අංක 24 දරණ පොල් පර්යේෂණ ව්‍යවස්ථාවට අනුව 1929 දී පොල් පර්යේෂණ ආයතනය ආරම්භ කර ඇත්තේ පොල් පර්යේෂණ යෝජනා ක්‍රමය ලෙසය. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන මධ්‍යස්ථානය ලුණුවිල බණ්ඩිරිප්පුව වත්තේ පිහිටවනු ලැබූ අතර එය ප්‍රවේණි, රසායන විද්‍යා හා පාංශු රසායන විද්‍යා නම් වූ තාක්ෂණික අංශ තුනකින් සමන්විත විය. 1950 දී නීතිගත කරනු ලැබූ අංක 37 දරණ පොල් පර්යේෂණ පණතින් පසු මෙය ලංකා පොල් පර්යේෂණ ආයතනය ලෙස යලි නම් කරනු ලැබිණි. 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පණත පැනවීමත් සමඟ 1972 දී පොල් පර්යේෂණ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි කාර්යභාරය වනුයේ පොල් පර්යේෂණ ආයතනයේ පාලන මණ්ඩලය ලෙස කටයුතු පවත්වාගෙන යාමයි.

පොල් පර්යේෂණ මණ්ඩලය (පො.ප.ම)

පොල් පර්යේෂණ මණ්ඩලය එහි පාලන මණ්ඩලය වන අතර ආයතනයේ පාලන කටයුතු හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ එම මණ්ඩලය මඟිනි. පොල් සංවර්ධන පණතේ කොන්දේසි වලට අනුකූලව පොල් පර්යේෂණ මණ්ඩලය, අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 11කින් සමන්විත වේ. මින් එක් සාමාජිකයෙක් ආයතනයේ සභාපති ලෙස පත් කරනු ලැබේ. ආයතනය පාලනය කරනු ලබන්නේ පොල් පර්යේෂණ මණ්ඩලය මඟිනි. සාමාජිකයින් වසර 03ක් සඳහා පත් කරනු ලබන අතර, ඔවුහු නැවත වරක් පත්කිරීම සඳහා ද සුදුසුකම් ලබති. පසුගිය වසර සඳහා රැස්වීම් 09ක් පවත්වන ලදී.

මණ්ඩල සාමාජිකයින්	පැමිණීමේ වාර්තාව
ජයන්ත වික්‍රමසිංහ මහතා සභාපති/ පො.ප.ම	9/9
සුරේකා අත්තනායක මිය/ අමාත්‍යාංශ නියෝජිතවරිය	8/9
ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් මහතා, අධ්‍යක්ෂ ජනරාල්/කෘ.දෙ	5/9
ආචාර්ය එස්.එෆ්.එන්. සිල්වා මහතා/ පො.ව.ස (නියෝජිත)	9/9
ජේ.එම්.ආර්.පී. ජයසිංහ මහතා/ භාණ්ඩාගාර නියෝජිත	4/4
ආර්.ඒ.එල්. උදය කුමාර මහතා/භාණ්ඩාගාර නියෝජිත	4/4
බන්දුල එගොඩගේ මහතා	7/9
ප්‍රභාත් විමල් කුමාර මහතා / අධ්‍යක්ෂ	7/8
ලේකම් / කෘ.ප.ප්‍ර.ස චිත්‍රාල් ජයවර්ණ මහතා	7/8
ආචාර්ය සනාතනී රණසිංහ මිය, අධ්‍යක්ෂ/පො.ප.ආ	9/9

පො.ප.ම: පොල් පර්යේෂණ මණ්ඩලය
කෘ.දෙ: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘ.ප.ප්‍ර.ස: කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
පො.ප.ආ: පොල් පර්යේෂණ ආයතනය
පො.ව.ස: පොල් වගාකරුවන්ගේ සංගමය

විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනයේ විගණන හා කළමනාකරණ සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා වසර තුළ රැස්වීම් තුනක් පවත්වන ලදී.

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

	නම	පැමිණීමේ වාර්තාව
	ජේ.එම්.ආර්.පී. ජයසිංහ මහතා	01/01
	ආර්.ඒ.එල් උදය කුමාර මහතා	02/02
අමාත්‍යාංශ නියෝජිත	සුරේකා එන්. අත්තනායක මිය	03/03
මණ්ඩල සාමාජික	ආචාර්ය එස්.එෆ්.එන්. සිල්වා මහතා	03/03
නිරීක්ෂක (වි.දෙ)	එල්.පී. ජයන්ත පුෂ්පකුමාර මහතා	01/01
	එස්.යූ.ඩී. මනවසිංහ මහතා	02/02
අධ්‍යක්ෂ/පො.ප.ආ	ආචාර්ය සනාතනී රණසිංහ මිය	03/03
අභ්‍යන්තර විගණක	පී.ඩබ්.ඒ. ප්‍රනාන්දු මහතා	03/03
කැඳවුම්කරු,පො.ප.ආ/වි.ක අතිරේක අධ්‍යක්ෂ	ආචාර්ය ලලිත් පෙරේරා	02/03

වි.දෙ : විගණකාධිපති දෙපාර්තමේන්තුව

(ජේ. එම්. ආර්. පී. ජයසිංහ මහතා එක් රැස්වීමක් සඳහා සහභාගි විය. ජයසිංහ මහතා වෙනුවට උදය කුමාර මහතාව පත් කරන ලදී. ජයන්ත පුෂ්පකුමාර මහතා විශ්‍රාම ගත්තේ ය. එයට පසු එස්. යූ. ඩී. මනවසිංහ මහතාව පත් කරන ලදී).

සභාපතිතුමාගේ පණිවිඩය



පොල් පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකාව තුළ මෙන්ම ලොව පුරා පොල් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ජයග්‍රහණ අත්කර ගනිමින් පොල් ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් වල ඉදිරියෙන්ම සිටියි. කෙසේ වුවද කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසර මුළු ලොවටම කැළඹිලි සහිත වකවානුවක් වූ බව නොරහසකි. මෙම වසර තුළ මෙරට බොහෝ කර්මාන්තයන්හි පිරිහීමේ ප්‍රවණතාවයක් පැවතියද, පොල් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් පොල් පර්යේෂණ ආයතනයට උදම් ඇනිය හැකි ජයග්‍රහණ කිහිපයක් ලබා ගැනිමට හැකි විය.

නව ප්‍රවේශයක් ලෙස බොහෝ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් හට පොල් පර්යේෂණ ආයතනය මගින් සොයා ගන්නා ලද විවිධාකාර පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම සඳහා පොල් පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ "ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම" පිහිටුවා එහි සේවය ලබා දීම අරඹන ලදී. මෙමගින් පිබිදෙන ව්‍යවසායකයින් හට ආත්ම විශ්වාසයකින් යුතුව පොල් ආශ්‍රිත නව නිපැයුම් ඇසුරින් දේශීය හා විදේශීය වෙළඳපොළවල් ගවේෂණය කිරීමට මඟ සැලසේ. මෙය පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින්ගේ විශිෂ්ඨ ජයග්‍රහණයක් වන අතර, එමගින් පෙන්වා දෙන්නේ ඔවුන් පොල් ක්ෂේත්‍රය සඳහා නව පර්යේෂණ සොයා ගැනීම් සිදු කිරීමට පමණක් කැප වී නොසිට පොල් ආශ්‍රිත නව නිෂ්පාදන හා තාක්ෂණය නව ප්‍රවේශයන් කරා බෙදා හැරීමටද සූදානමින් සිටින බවයි. එමෙන්ම, පොල් පර්යේෂණ ආයතනය විසින් ශ්‍රී ලංකා උස × මැලේසියානු රතු කුන්දිරා යන ප්‍රභේද අතර දෙමුහුම්කරණය මගින් නව පොල් දෙමුහුමක් නිපදවන ලදී. CRISL 2020 ලෙස නම් කරන ලද මෙම දෙමුහුම ඉදිරියේදී පොල් පර්යේෂණ ආයතනය විසින් වාණිජ මට්ටමින් නිකුත් කළ හැකි බලාපොරොත්තු තබා ගත හැකි පොල් ප්‍රභේදයක් ලෙස ඉස්මතු වනු ඇත.

රටේ පැවති සීමාකාරී වතාවරණයන් යටතේ හා ආර්ථිකමය අපහසුතා මධ්‍යයේ වුවද, කෙටි හා දිගු කාලීන පර්යේෂණ ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රමාණයක් පොල් පර්යේෂණ ආයතනය විසින් මෙහෙයවන ලදී. එම ක්‍රියාකාරකම් වල දායකත්වය, නව සොයා ගැනීම්, නවෝත්පාදන හා තාක්ෂණයන් ලෙස ඉදිරියේදී එළි දකිනු ඇත. පොල් පර්යේෂණ ආයතනය විසින් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ආනයන හා අපනයන කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති නිර්දේශයන් හා ප්‍රතිපත්ති සම්පාදනයන් වසර පුරා සිදු කරන ලදී. එමෙන්ම පොල් පර්යේෂණ ආයතනය වැවිලි ක්ෂේත්‍රයට කැප වූ ජාතික පර්යේෂණ ආයතනයක් වශයෙන් මෙම වසර තුළ රටේ පැවති පොහොර ආශ්‍රිත

ගැටළුකාරී තත්ත්වයන් සඳහා පිළියම් යෙදීමේදී වැදගත් දායකත්වයක් ලබා දෙන ලදී. ආයතනයේ සිටින විශිෂ්ඨ විද්‍යාඥයින් පොල් ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී විවිධ ජාතික හා ජාත්‍යන්තර රැස්වීම් සඳහා සම්පත්දායකයන් ලෙස සමස්ත විද්‍යා ප්‍රජාවටම සිය සේවය ලබා දෙන ලදී.

මෙම වසර තුළ ආයතනයේ විද්‍යාඥයින් හා සමස්ත කාර්ය මණ්ඩලය ලබා ගත් සාර්ථකත්වය සඳහා සුභාශිංෂණය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම ගරු ඇමතිවරුන් හා අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් විසින් ලබා දෙන ලද උපකාර, සහයෝගය සහ මඟ පෙන්වීම අගය කරමි.

පොල් පර්යේෂණ ආයතනයේ ඉදිරි සියලු කාර්යයන් සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

ජයන්ත වික්‍රමසිංහ

සභාපති

පොල් පර්යේෂණ මණ්ඩලය

අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය



පොල් පර්යේෂණ ආයතනය සිය පර්යේෂණ ඇසුරින් තාක්ෂණ නිර්දේශයන් ලබාදීම, සංවර්ධන ක්‍රියාදාමයන් සිදුකිරීම සහ පාර්ශ්වකරුවන් වෙත ලබාදෙන සේවාවන් තුළින් පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා අඛණ්ඩ දායකත්වයක් ලබාදෙන ලදී. මේ වසර තුළ ලබන ලද විශිෂ්ඨතම ජයග්‍රහණ වන්නේ ශ්‍රී ලංකා උස × මැලේසියානු රතු කුන්දිරා දෙමුහුම, "CRISL 2020" ලෙස ජනතාව වෙත හඳුන්වා දීම, 2020 වසර සඳහා අස්වනු පුරෝකථනය වන ගෙඩි මිලියන 2708 ට එරෙහිව, වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2818 ක් ලෙස ඇස්තමේන්තු ගත කිරීම, 2021 වසරේ මුල් මාස 08 සඳහා අස්වනු අනාවැකිය, ගෙඩි මිලියන 2386 ක් ලෙස පුරෝකථනය කිරීම (එය වසර 2020 හා සැසඳීමේදී 19% ක වැඩිවීමකි), ජාන සම්පත් මධ්‍යස්ථානයන්හි වැඩි දියුණු කළ ප්‍රභේද වල බීජ මිලියන 01 කට ආසන්න ප්‍රමාණයක් (බීජ 994,671 ක්) නිපදවීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සැකසීම පිළිබඳ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට පුහුණුව ලබා දීමටත්, ඒ ආශ්‍රිත ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමටත් හැකි වන සේ "ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම" විවෘත කිරීම, රසකැවිලි කර්මාන්තයේදී භාවිතා වන පාම් තෙල් වෙනුවට පොල් තෙල් යොදාගත හැකි වන පරිදි පොල් තෙල් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම, කහ තිත් පළඟැටියා හා සුදු මැස්සා මර්දනය සඳහා අන්තර් නිර්දේශයක් නිකුත් කිරීම, දකුණු පළාත තුළ "වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය" කළමනාකරණය, විශේෂයෙන්ම වෙනත් ප්‍රදේශ වලට රෝගය පැතිරීම වැළැක්වීම සඳහා ආරක්ෂිත කලාපය අඛණ්ඩව පවත්වා ගෙන යාම, පොල් පර්යේෂණ ආයතනයේ වතු වල ජීව අඟුරු නිෂ්පාදන ඒකක 2ක් ඉදිකිරීම හා කාර්යක්ෂම ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතියක තිබිය යුතු මූලික අවශ්‍යතා නිර්දේශ කිරීම යන ඒවාය.

පොල් ආශ්‍රිත නිෂ්පාදන හා ඒවායේ ආදේශක සඳහා ආනයනය හා අපනයනය ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන මෙන්ම, පොල් තෙල් හා පාම් තෙල් ආශ්‍රිත විශේෂිත පාරිභෝගික ද්‍රව්‍ය බදු වෙනස් කිරීම් හා පොල් වගාව සඳහා ජාතික පොහොර අවශ්‍යතාවයට අදාළ ප්‍රතිපත්ති නිර්දේශ අප අමාත්‍යාංශයට ලබාදීම, පොල් පැළ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන වියදම ඇස්තමේන්තුගත කිරීමට සූත්‍රයකුත්, සැපයුම පදනම් කරගෙන පොල් මිල සඳහා අනාවැකි පළ කිරීමට මූලික ආකෘතියකුත් නිර්මාණය කිරීම යන කටයුතු කරන ලදී.

දැනට කෙරීගෙන යන පර්යේෂණ සම්බන්ධයෙන් ගත් කළ, වැඩි උෂ්ණත්වය/නියඟයට මෙන්ම වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය හා ඇසේරියා මයිටාවාට ඔරොත්තු දෙන පොල් වගා දර්ශ තේරීම හා අලුතින් නිපදවීම, පටක රෝපන තාක්ෂණය වැඩි දියුණු කිරීම, පොල් වගාවන් සඳහා ජෛව අඟුරු හා නගර සභා ඝන අපද්‍රව්‍ය යෙදීම, නව වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම, අගය එක්

කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණය සොයා ගැනීම හා වැඩි දියුණු කිරීම, කොහු ක්ෂේත්‍රය සඳහා යන්ත්‍ර සුත්‍ර නිෂ්පාදනය කිරීම හා තවදුරටත් වැඩි දියුණු කිරීම, පොල් තෙල් හා මීරා ආශ්‍රිත නිෂ්පාදන වල සෞඛ්‍යමය ගුණාංග අධ්‍යයනය කිරීම, පොල් නැවත වගා වැඩසටහන් වල සාර්ථකත්වය ඇගයීම යනාදිය සාර්ථකව සිදු කරගෙන යන ලදී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ තාක්ෂණ හුවමාරු කටයුතු තදබල ලෙස සීමා වුවද, තාක්ෂණ උද්‍යානය නඩත්තු කරගෙන යාම හා සැප්තැම්බර් 02 වෙනි දිනට යෙදුණු ජාත්‍යන්තර පොල් දිනය උත්සවාකාරයෙන් සැමරීම සිදු කරන ලදී. පොල් වගාකරුවන් සඳහා ලබාදෙන සේවාවන් ලෙස, ඇසේරියා මයිටාවා පාලනය සඳහා විලෝපික මයිටාවන් ලබා දීම, පොල් දළඹුවා සඳහා පරපෝෂිතයින් ලබා දීම, රතු කුරුමිණි ආකර්ෂණ පෙරමෝනය නිපදවා වගාකරුවන් වෙත ලබා දීම, පොහොර නිර්දේශයන් හා පොල් ලෙලි ආශ්‍රිත අපනයන නිෂ්පාදන සඳහා අවශ්‍ය වන විශ්ලේෂණ සේවාවන් ලබා දීම සිදු කරන ලදී.

මීට අමතරව විද්‍යා උපුටා දැක්වීම් දර්ශක සඟරාවන්හි (SCI) පර්යේෂණ පත්‍රිකා 17 ක්ද, ජාත්‍යන්තර සඟරාවන්හි පර්යේෂණ පත්‍රිකා 09 ක්ද, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා 21 ක්ද, ග්‍රන්ථ පරිච්ඡේද 04 ක්ද, ප්‍රතිපත්ති නිර්දේශ වාර්තා 03 ක්ද, වෙනත් වාර්තා 09 ක්ද, 2020 වසරේදී ප්‍රකාශයට පත් කෙරිණි.

වසර 2020 දී පොල් පර්යේෂණ ආයතනයේ සියළුම වතු ඒකාබද්ධව පොල් ගෙඩි මිලියන 3.94 ක් නිෂ්පාදනය කරන ලදී.

අවසන් වශයෙන්; වසර 2020 දී ලද මේ සියළුම ජයග්‍රහණ සඳහා ඉවහල් වූ පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම හා සහයෝගය අගය කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. එමෙන්ම, වැවිලි අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා, ලේකම්වරුන් හා නිලධාරීන්, සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර පුරා ලබා දෙන ලද මඟ පෙන්වීම හා සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත මාගේ කෘතඥතාවය හිමිවේ.

පොල් පර්යේෂණ ආයතනයේ සියළු කර්තව්‍යයන් සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යයි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය සනාතනී රණසිංහ.

අධ්‍යක්ෂ,

පොල් පර්යේෂණ ආයතනය.



පර්යේෂණ නිර්දේශ

කහ තිත් පළඟැටියා පාලනය

වගා සංරක්ෂණ අංශය

අන්තර් නිර්දේශයක් ලෙස කාබෝසල්ෆාන් මිලි ලීටර් 5ක් ජලය ලීටර් 01ක් සමඟ මිශ්‍ර කර ඉසීම නිර්දේශ කරන ලදී.

සුදු මැස්සන් පාලනය

වගා සංරක්ෂණ අංශය

අධික හානියකදී අන්තර් නිර්දේශයක් ලෙස පහත සඳහන් කෘමිනාශක ඉසීම නිර්දේශ කරන ලදී.

a) තයෝමෙතොක්සම් ග්‍රෑම් 03ක් ජලය ලීටර් 10ක

b) කාබෝසල්ෆාන් මිලි ලීටර් 20ක් ජලය ලීටර් 10ක

c) තයෝමෙතොක්සම් + ක්ලොරන්ට්‍රනිලිප්‍රෝල් ග්‍රෑම් 2.5ක් ජලය ලීටර් 10ක



ප්‍රතිපත්ති යෝජනා

ප්‍රතිපත්ති යෝජනා 1:
පොල් තෙල් නිෂ්පාදනය සඳහා කොප්පරා ආනයනය කිරීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

කොප්පරා ආනයනය කිරීම මඟින් පොල් වගාව හා කර්මාන්තය වෙත ඇති විය හැකි බලපෑම් විශ්ලේෂණය සිදු කළ අතර, පහත සඳහන් කරුණු අනුව නිර්දේශ ලබා දෙන ලදී.

1. ජාන පදනම

මෙතෙක් බොහෝ පොල් වගාකරන රටවල ඇති මාරාන්තික රෝග ශ්‍රී ලංකාවට ඇතුළු වීම මේ දක්වා පාලනය කර ගැනීමට සමත් වී ඇත. නමුත් කොප්පරා ආනයනය මඟින් මෙවැනි රෝග සහ පළිබෝධ රටට ඇතුළු වීමේ අවදානමක් ඇත. මේ තුළින් ඉතා අඩු ජාන විවිධත්වයක් සහිත ශ්‍රී ලංකාවේ පොල් වගාව ඉතා ප්‍රබල හානිකර තත්ත්වයන්ට ගොදුරු විය හැකි අතර, එමඟින් ශ්‍රී ලංකාවේ පොල් වගාව පවත්වාගෙන යාමේ ගැටලු සහගත තත්ත්වයන්ට පත් වේ.

2. ගුණාත්මක ගැටලු

හොඳ තත්ත්වයේ පොල් තෙල් නිස්සාරණය කර ගැනීම සඳහා ගුණාත්මයෙන් ඉහළ කොප්පරා භාවිතා කළ යුතුයි. ගුණාත්මයෙන් අඩු කොප්පරා ආනයනය කිරීමෙන් නිපදවන පොල් තෙල් ගුණාත්මයෙන් අඩු වේ. ගුණාත්මයෙන් අඩු කොප්පරා වල ඇති ඇෆ්ලටොක්සින් සහ බහු ඇරෝමැටික හයිඩ්‍රොකාබන පරිභෝජනය ඉතා විෂ සහිත වේ.

3. කොප්පරා ආනයනය මඟින් දේශීය තෙල් කර්මාන්තයට ඇති වන බලපෑම

කොප්පරා ආනයනය කර තෙල් නිෂ්පාදනය කර, ප්‍රතිඅපනයනය මඟින් දේශීය පොල්තෙල් කර්මාන්තයට ඇති වන බලපෑම අවම වේ. නමුත් තීරුබදු සහන යටතේ කොප්පරා ආනයනය කර දේශීයව අඩු මිලට පොල් තෙල් දේශීය වෙළඳපොළට මුදා හැරීම සිදු කළහොත්, එය දේශීය පොල් තෙල් කර්මාන්තයට ඉතාමත් අහිතකර බලපෑමක් ඇති කරයි. තවද, කොප්පරා සාමාන්‍ය තීරුබදු වලට යටත්ව ආනයනය කිරීමෙන් නිපදවන පොල් තෙල්වල මිල දේශීය පොල් තෙල් මිලට වඩා ඉහළ අගයක් ගනී. එබැවින්, සාමාන්‍ය තීරුබදු යටතේ කොප්පරා ආනයනය කිරීමෙන් නිපදවන පොල් තෙල් දේශීය සහ විදේශීය වෙළඳපොළෙහි තරඟකාරී නොවනු ඇත.

ප්‍රතිපත්ති නිර්දේශය

කොප්පරා ආනයනය කිරීමෙන් කර්මාන්ත සඳහා අවශ්‍ය පොල් සැපයුම සපුරාලිය හැකි වුවත් එමඟින් දේශීය පොල් සහ පොල් තෙල් මිලට ඇති වන අහිතකර බලපෑම, නව රෝග සහ පළිබෝධ ඇතුළු වීමට ඇති හැකියාව සහ විදේශ විනිමය වැය වීම යන කරුණු සැළකිල්ලට ගෙන කොප්පරා ආනයනය පොල් කර්මාන්තය දියුණු කිරීම සඳහා සුදුසු විසඳුමක් නොවන බව පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ කරයි.



පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ



පොල් ප්‍රභේද වැඩිදියුණු කිරීම

පොල් නැවත වගා කිරීමේ ජාතික වැඩ සටහන සඳහා CRISL2020 නමින් නව පොල් වගා දර්ශයක් නිර්දේශ කිරීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

2020 සැප්තැම්බර් දෙවන දින ජාත්‍යන්තර පොල් දිනය සැමරීම නිමිත්තෙන් පැවති උත්සවයේදී CRISL2020 නමින් නවතම දෙමුහුම් පොල් ප්‍රභේදයක් ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් හඳුන්වාදෙන ලදී. මෙම පොල් ප්‍රභේදය ශ්‍රී ලංකා උස හා මලයානු රතු කුන්දිරා අතර දෙමුහුමක් වන අතර වසර 3 ½ වැනි කෙටි කාලයකින් ඵලදාවක් ලබාදෙන ප්‍රභේදයකි. මෙය පොල් මයිටා හානියට ද යම් ප්‍රතිරෝධීතාවයක් දක්වනු ඇතැයි අපේක්ෂා කරන අතර ගෙවතු සඳහා ඉතා යෝග්‍යය. එසේම පාංශු යෝග්‍යතා S1-S3 ශ්‍රේණි වලට අයත් මහා පරිමාණ වතු වල උසස් කළමනාකරණ තත්ත්ව යටතේ මහා පරිමාණ වගාවට ද උචිතය. 2021 වසර තුළ මෙම ප්‍රභේදයෙන් බීජ පොල් 2500 පමණ නිපදවීමට අපේක්ෂා කරන අතර බීජ නිෂ්පාදනය ඉදිරි කාලයේදී වැඩි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම වගා දර්ශයේ නියගයට ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් අධ්‍යයනය කරමින් ඇත.



CRISL2020 නවතම දෙමුහුම් පොල් ප්‍රභේදය හඳුන්වාදීම

වර්ග පරම්පරා අධ්‍යයනය (ජනිත පරීක්ෂාව) හා නියඟයට ඔරොත්තු දෙන ප්‍රවේණිදර්ශ හඳුන්වාදීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

අඹකැලේ විශේෂ වගාදර්ශයේ වර්ග පරම්පරා අධ්‍යයන කටයුතු 1990 දශකයේ මුල් භාගයේ ආරම්භ වූ අතර ඒ යටතේ 1992 වසරේ දී අඹකැලේ විශේෂ වගාදර්ශයේ යුගල මුහුම් මගින් නිපදවූ ජනිතයන් CRIC60 වගාදර්ශය සමග අඹකැලේ බීජ පොල් උයනේ ක්ෂේත්‍ර අංක 11A කොටසේ සිටුවා ඇත. අනාගත අභිජනන වැඩසටහන් වල ප්‍රයෝජනය සඳහා අඹකැලේ විශේෂ වගාදර්ශයේ යුගල මුහුම් මගින් නිපදවූ ජනිතයන් (ගහනය තුළ වරණයට ලක් වූ) සහ CRIC60 වගාදර්ශය (ගහනය තුළ වරණයට ලක් නොවූ) අතර සංසන්දනාත්මකව අධ්‍යයනයක් 2020 වසරේදී සිදුකරන ලදී. මෙහිදී අඹකැලේ විශේෂ වගාදර්ශයේ යුගල මුහුම් මගින් නිපදවූ ජනිතයන් CRIC60 වගාදර්ශයට සාපේක්ෂව ඉහළ ඵලදාවක් පෙන්වන ලද අතර 2017-2018 අඩු වර්ෂා වසර වලදී ද CRIC60 වගාදර්ශයට සාපේක්ෂව ඉහළ ඵලදාවක් අඹකැලේ විශේෂ වගාදර්ශයේ යුගල මුහුම් මගින් නිපදවූ ජනිතයන් විසින් පෙන්වන ලදී. ඵලදා ස්ථායිතා දර්ශක යොදාගෙන කරන ලද පරීක්ෂණ වලදී ද අඹකැලේ විශේෂ වගාදර්ශයේ යුගල මුහුම් ජනිතයන් වැඩි උපයෝජ්‍යතාවයක් පෙන්වන ලදී. මෙම අධ්‍යයනය තුළින් ඉදිරි නියඟයන්ට ඔරොත්තු දීම පිළිබඳ අභිජනන වැඩසටහන් වලදී මව් ශාක ලෙස යොදා ගැනීමට සුදුසු පොල් ගස් 20 ක් හඳුනාගන්නා ලදී.



අඹකැලේ විශේෂ හා CRIC 60 ප්‍රභේද වල අවුරුදු 06ක කාල සීමාවක් තුළ මධ්‍යන්‍ය ඵලදාවේ විචලනය

වැලිගම කොළ මැලවීමේ රෝගයට විවිධ පොල් වගා දර්ශ හා දෙමුහුම් වර්ග දක්වන ප්‍රතිරෝධිතාවය ඇගයීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශ්‍රී ලංකාව තුළ දැනට නිර්දේශ කර ඇති වගාදර්ශ හා දෙමුහුම් වර්ග වැලිගම කොළ මැලවීමේ රෝගයට දක්වන ප්‍රතිරෝධිතාවය ඇගයීම සඳහා ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘතියක් 2009 වසරේදී ආරම්භ කරන ලදී. මේ යටතේ වගාදර්ශ හා දෙමුහුම් වර්ග 14ක් රෝගී කලාපයේ ස්ථාන දෙකකදී, අධ්‍යයන කරන ලදී. මෙයින් රෝගය තදින් පැතිරී තිබූ විලේගොඩ වත්තේ පිහිටි පර්යේෂණ වගාවේ විවිධ වගා දර්ශ හා දෙමුහුම් රෝගයට ගොදුරු වීමේ අවස්ථා වැඩි ප්‍රමාණයක් නිරීක්ෂණය වූ අතර කොළ කුන්දිරා විශේෂය පමණක් රෝගයට ගොදුරු නොවී ඇත. 2009 වනවිට රෝගී ගස් නොතිබූ බදුවත්තේ ස්ථාපනය කර ඇති පර්යේෂණ වගාවේ, 2018 වසරේදී මුල්වරට පැරණි වගාවේ රෝගී ගස් නිරීක්ෂණය වූ අතර මේ වනවිට පර්යේෂණ වගාවේ කොළ කුන්දිරා × ටැග්නනාන් උස, CRIC65- කහ සහ CRIC60 වගා දර්ශ රෝගයට ගොදුරු වී ඇත.

මේ පර්යේෂණයේ ප්‍රතිඵල අනුව පෙනී යන්නේ අඹකැලේ නිෂ්පාදිත කොළ කුන්දිරා × උස (CRIC65- කොළ) වගා දර්ශයද වැඩි රෝගී ගස් ඇති වටාපිටාවකදී රෝගයට ගොදුරු වන බවයි. නමුත්, මෙම රෝගී කලාපයේ ඇති නිරෝගී කොළ කුන්දිරා හා උස වර්ග අතර දෙමුහුම් නිෂ්පාදනය මගින් වැලිගම කොළ මැලවීමේ රෝගයට යම් හෝ ප්‍රතිරෝධිතාවයක් අත්කර ගැනීම සඳහා මේ වනවිට පර්යේෂණ දියත්කර ඇත. මීට අමතරව ෆයිටොප්ලස්මා රෝග වලට ප්‍රතිරෝධිතාවයක් දක්වන විදේශීය ප්‍රභේද යොදා ගැනීම කෙරෙහි ද අවධානය යොමුකර ඇත.



වැලිගම කොළ මැලවීමේ රෝගය ආසාදිත කප්රුවන පැළයක් (විලේගොඩවත්ත, වැලිගම)

අලිංගික කළල හා ක්ලෝන පැළ ජනනය ප්‍රේරණය කිරීම.

පටක රෝපණ අංශය

පොල් පටක රෝපණ ක්‍රමවේදයේ විවිධ වර්ධන අවධීන් වලදී රෝපණ මාධ්‍යයයේ වර්ධක හෝමෝන සාන්ද්‍රණ වැඩි කිරීමෙන් ක්ලෝන පැළ ජනනය වැඩි දියුණු කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. කිණක පටකය ගුණන අවධීන් තුනේදී Y3 මූලික රෝපණ මාධ්‍යයට එක් කරන 2,4-D (2,4- ඩයික්ලෝරෝෆීනෝක්සිඇසිටික් අම්ලය) සාන්ද්‍රණය 180 µM සිට 300 µM දක්වාත් ක්ලෝන පැළ ජනන අවධියේදී BAP (6-බෙන්සයිල් ඇමයිනෝ පියුරීන්) සාන්ද්‍රණය 20 µM සිට 300 µM දක්වාත් වැඩි කර සංසන්දනය කරන ලදී. මෙම වර්ධක හෝමෝන සාන්ද්‍රණ වැඩි කිරීම මගින් කිණක පටකය ගුණනය හා ක්ලෝන පැළ ජනනය සතුටුදායක මට්ටමකින් වැඩිකර ගැනීමට හැකිවිය.

වර්ධක හෝමෝනයක් වන ඩයිකැම්බා, බ්‍රසිනොස්ටෙරොයිඩ්, කැල්සියම් අයනොෆෝර්, පොලිඇමයින් වැනි රෝපණ මාධ්‍යය සංඝටක මගින් පොල් පටක රෝපණයෙදී ඇති වන පටක දුඹුරු පැහැවීම අඩු කිරීමට සහ අලිංගික කළල ජනනය වැඩි දියුණු කිරීමට ඇති බලපෑම ඇගයීමට ලක් කරන ලදී. මේ සඳහා ඔක්සින් හෝමෝන වර්ග දෙකක් (2,4-D සහ ඩයිකැම්බා), කැල්සියම් අයනොෆෝර් A23187, 22(S), 23(S)-හෝමෝබ්‍රසිනොස්ටෙරොයිඩ්, එක්ව සහ වෙන් වෙන් වශයෙන් කිණක පටක ගුණන සහ අලිංගික කළල ජනන රෝපණ මාධ්‍යය තුළට එක් කරන ලදී.

එම පරීක්ෂණ ප්‍රතිපල මගින්, කළල ජනන ව්‍යුහයන් සැලකිය යුතු ලෙස වැඩි ප්‍රමාණයක් දක්නට හැකි වූයේ ඩයිකැම්බා අඩංගු රෝපණ මාධ්‍යය වලට වඩා 2,4-D අඩංගු රෝපණ මාධ්‍ය තුළදී ය. එමෙන්ම, 2,4-D සාන්ද්‍රණ දෙකක් (600 සහ 300 µM) සමග පොලිඇමයින් වර්ග තුනක් (ස්පර්මීන්, පියුට්‍රසීන් සහ ස්පර්මිඩීන්) කිණක පටක ගුණන මාධ්‍යයට සහ අලිංගික කළල ජනන මාධ්‍යයට සංයෝග කර පරීක්ෂා කරන ලදී. එම පරීක්ෂණ වලදී, කළල ජනක ව්‍යුහ, කළල ජනක කිණක පටක, කළල ජනක නොවන කිණක පටක සහ දුඹුරු වූ කිණක පටක විවිධ ප්‍රමාණ වලින් දක්නට ලැබුණි. තවද, ප්‍රතිඵලවලින් පෙන්නුම් කළේ අඩු 2,4-D මට්ටම (300 µM) මගින් කළල ජනක කිණක වල පටක දුඹුරු පැහැවීම සැලකිය යුතු ලෙස අඩු කර ඇති බවයි.

2015 වසරේ බණ්ඩිරිප්පුව වත්තේ වගා කරන ලද CRIC 65 පටක රෝපිත ක්ලෝන ගස් වල මල් හට ගැනීම මේ වසරේදී ආරම්භ විය.





මල් හටගත් පටක රෝපිත පොල් පැළ

පොල් පටක රෝපණය සඳහා නව පූර්වක පටක හඳුනා ගැනීම.

පටක රෝපණ අංශය

පොල් පටක රෝපණය සඳහා නව පූර්වක පටකයක් ලෙස නොමේරූ ශාක පත්‍ර යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ළපටි පොල් පත්‍ර විවිධ රෝපණ මාධ්‍යය සංයුතීන් තුළ රෝපණය කරන ලදී. ඩිම්භ කෝෂ රෝපණ ක්‍රමය තුළින් ලබා ගත් ක්ලෝන පැළ ගුණනය කිරීම සඳහා වූ නව ක්‍රමවේදයක් සොයා ගැනීමේ අරමුණ ඇතිව මෙම පරීක්ෂණ සඳහා නළස්ථ කළල රෝපිත පැළ වල ළපටි පත්‍ර යොදා ගන්නා ලදී. මූලික පරීක්ෂණවල ප්‍රතිඵලවලින් හෙළි වූයේ, පරීක්ෂා කරන ලද රෝපණ තත්ත්ව වලදී පත්‍රවල පාදස්ථ කොටස හොඳින් ප්‍රතිචාර දක්වන බවයි. එබැවින්, නළස්ථ කළල රෝපිත පැළ වල පත්‍රවල පාදස්ථ කොටස පමණක් විවිධ රෝපණ මාධ්‍ය සංයුතීන් 4 ක රෝපණය කරන ලදී. බොහෝ පූර්වක පටක 2-3 ගුණයකින් විශාල වී ක්‍රමයෙන් දුඹුරු පැහැයට හැරෙන අතර ඇතැම් පටක වලින් එම්බ්‍රොයිඩ්ස් වැනි ගෝලාකාර ව්‍යුහයන් ජනනය විය. මෙම ගෝලාකාර ව්‍යුහයන්ගේ ප්‍රරෝහණය වැඩිදුර පරීක්ෂණ වලදී ඇගයීමට ලක් කෙරේ.



ළපටි පත්‍ර පූර්වක මගින් නළස්ථ ප්‍රරෝහ වර්ධනය



පොල් නිෂ්පාදන තාක්ෂණය

ශ්‍රී ලංකා පොල් ත්‍රිකෝණයේ වියළි සහ අතරමැදි කලාපවල පවතින පොල් වගාවන්හි ඇති ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිවල වර්තමාන තත්ත්වය.

පාංශු හා ශාක පෝෂණ අංශය

දැනට පොල් වගාවන්වල ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතීන්වල තත්ත්වය ඇගයීම සහ ඒවායේ අසමත්වීම්වලට හේතු සොයා බැලීම සඳහා තාක්ෂණික සමීක්ෂණයක් සිදු කරන ලදී.

එම සමීක්ෂණය මඟින් වගාකරුවන් විසින් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිවල නිවැරදි ක්‍රියාකාරිත්වයට අත්‍යාවශ්‍ය උපාංග බොහෝමයක් පද්ධතිවල සවිකර නොමැති බවත් එම පද්ධතීන් ස්ථාපිත කිරීමේදී ජල ප්‍රභවයේ ධාරිතාවය නිර්ණය කිරීම, ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම වැනි වැදගත් නිර්මාණ පියවරවල් සිදු කර නොමැති බවත් අනාවරණය විය. එමනිසා පොල් වගාවන්වල ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතීන් අසමත්වීම්වලට ප්‍රධාන හේතුව, ඒවා ස්ථාපිත කිරීමට හා නඩත්තු කිරීමට වගාකරුවන් හට ප්‍රමාණවත් දැනුමක් නොමැති බව අනාවරණය විය.



රූපය 1: ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතියේ ප්‍රධාන පාලක පද්ධතිය

නාගරික ඝන අපද්‍රව්‍යවලින් සෑදූ කොම්පෝස්ට් පොල් වගාවන්වලට යෙදීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයකින් තොරව සහ පවතින පෝෂක සංයුතිය සලකා බැලීමකින් තොරව නාගරික ඝන අපද්‍රව්‍ය යොදා ගනිමින් සෑදූ කොම්පෝස්ට් පොල් වගාවන්වලට යෙදීම දැනටමත් සිදු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාවේ නගර සභා 20කින් ලබාගත් ඝන අපද්‍රව්‍ය යොදා ගනිමින් සෑදූ කොම්පෝස්ට් සාම්පල, පෝෂක තත්ත්වය සහ අවදානම් සාධක හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කරන ලදී.

මේවායේ කාබනික කාබන් ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් හඳුන්වා දුන් සුදුසු පරාසයේ පැවතිණි. ඒවායේ මහා පෝෂක ප්‍රමාණය විශාල පරාසයක වෙනස් වූ අතර(වගුව 1) බොහොමයක් සාම්පලවල අඩු මහා පෝෂක ප්‍රමාණයක් පැවතිණි.

වගුව 1: නාගරික ඝන අපද්‍රව්‍යවලින් සෑදූ කොම්පෝස්ට් සාම්පලවල පැවති පෝෂක ප්‍රමාණයන්

පෝෂකය	මධ්‍යනය (පරාසය) වියළි බරෙන් %	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් හඳුන්වා දුන් ප්‍රමිතිය (වියළි බරෙන්%)
නයිට්‍රජන් (N)	2.39 (0.92-3.96)	අවම 1
පොස්පරස් (P_2O_5)	0.39 (0.02-2.34)	අවම 0.5
පොටෑසියම් (K_2O)	0.63 (0.00-3.64)	අවම 1
කැල්සියම් (CaO)	1.05 (0.04-5.42)	අවම 0.7
මැග්නීසියම් (MgO)	0.18 (0.00-0.77)	අවම 0.5
කාබනික කාබන් (OC)	30.14 (13.98-39.25)	20
කාබන්/නයිට්‍රජන් අනුපාතය (C/N)	14 (6-36)	10-25

එහෙත් නාගරික ඝන අපද්‍රව්‍ය යොදා ගනිමින් සෑදූ කොම්පෝස්ට්වල පවතින සතුටුදායක කාබනික කාබන් ප්‍රමාණය සැලකූ විට එය පසෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට යොදා ගත හැකි ප්‍රභවයක විභවයක් පෙන්නුම් කරයි. නමුත් සමහර සාම්පලවල දැක්වූ ඉහළ කාබන්:නයිට්‍රජන් අනුපාතය නිසා පසෙහි කෙටි කාලීනව නයිට්‍රජන් නිශ්චල කිරීමේ හැකියාවක් පවතී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව නාගරික ඝන අපද්‍රව්‍ය යොදා ගනිමින් සෑදූ කොම්පෝස්ට් පොල් වගාවන්ට යෙදීමට අදහස් කරන්නේ නම් එහි පෝෂක වැඩි කිරීමේ සහ කාබන්:නයිට්‍රජන් අනුපාතය නිවැරදි කිරීමේ වැදගත්කම පෙන්නුම් කරයි.



රූපය 1: නාගරික ඝන අපද්‍රව්‍ය යොදා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම

පස වැඩි දියුණු කිරීමේ ප්‍රභවයක් වන ජීව අඟුරුවල නයිට්‍රජන් රඳවා ගැනීමේ හැකියා විභවය පිළිබඳ ඇගයීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

ජීව අඟුරු මඟින් පසෙහි නයිට්‍රජන් පෝෂක රඳවා තබාගැනීමේ හැකියාව අගයන ලද අතර එහි ප්‍රතිඵල පෙන්වා දෙන්නේ පසට ජීව අඟුරු බර අනුව 1% ක් එකතු කිරීමෙන් ඇමෝනියම් අයන කාන්දු වීම පාලක පරීක්ෂණයට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කළ අතර නයිට්‍රේට් අයන මත ජීව අඟුරුවල බලපෑම සැලකිය යුතු ප්‍රමාණයක් නොවිණි. අධ්‍යයනයේ ප්‍රතිඵල පෙන්වා දුන්නේ ජීව අඟුරුවලට පසෙහි ධන අයන රඳවා ගැනීමේ හැකියාව වැඩි දියුණු කළ හැකි බවයි. කෙසේ වෙතත්, මෙම ප්‍රතිඵල පසෙහි අනෙකුත් ධන අයන වන පොටෑසියම් (K+), මැග්නීසියම් (Mg+), කැල්සියම් (Ca+), සහ සෝඩියම් (Na+) රඳවා තබාගැනීමේ හැකියාව මත ද තහවුරු කර ගත යුතුයි.



රූපය 1: "Semi *in-situ* Leaching column" ඇගයීම

ආර්ථික වශයෙන් සාධ්‍ය පරිසර හිතකාමී ජීව අඟුරු නිෂ්පාදන පෝරණුවක මූලාකෘතියක් නිර්මාණය කිරීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

අඩු පිරිවැය, කුඩා පරිමාණ ජීව අඟුරු නිෂ්පාදන ක්‍රමය වඩාත් දියුණු කිරීමේ අරමුණින් අඩු පිරිවැය පරිසර හිතකාමී ජීව අඟුරු නිෂ්පාදන පෝරණුවක මූලාකෘතියක් (රූපය 1) නිර්මාණය කර, ගොඩනගා ඇත. මෙම නව නිර්මාණයේ අභිලාෂය වනුයේ පෙර පැවති සංවෘත ආසවන ක්‍රමය (රත් වීමේ වේගය 0.05 °C/s" උපරිම තාප විච්ඡේදන උෂ්ණත්වය 590 °C) මඟින් තාප විච්ඡේදනයට ලක් කිරීමෙන් නිපද වූ ජීව අඟුරුවල ගුණාත්මකභාවයෙන්ම ශක්තිය අපතේ යාම අවම කර ගනිමින්, තාප හානිය අඩු කර ගනිමින්, ඉන්ධන පරිභරණය අඩු කර ගනිමින් සහ පෝරණුවේ කල් පැවැත්ම ද වැඩි කර ගනිමින් ජීව අඟුරු නිෂ්පාදනය කිරීම වේ. වැඩි දියුණු කළ ජීව අඟුරු නිෂ්පාදන පෝරණුව (රූපය 2) සඳහා ගිනි ගඩොල් සහ මැටි ප්‍රධාන වශයෙන් භාවිතා කර ඇත. ග්ලිරිසීඩියා දඬු (*Gliricidia sepium*) වී පොතු (*Oryza sativa*) යන ජීව ස්කන්ධ යොදා ගෙන සාදන ජීව අඟුරුවල ගුණාංග හඳුනා ගැනීමට සහ ප්‍රශස්ත තාප විච්ඡේදන තත්ත්ව හඳුනා ගැනීමට නව පෝරණුව පරීක්ෂා කරමින් පවතී.



රූපය 1: ජීව අඟුරු නිෂ්පාදනයට යොදා ගන්නා අඩු පිරිවැය සංවෘත ආසවන ක්‍රමය

රූපය 2: වැඩි දියුණු කළ ජීව අඟුරු නිෂ්පාදන පෝරණුවේ මූලාකෘතිය

පරිණත පොල් වගාව සඳහා ජීව අඟුරු භාවිතයෙන් තිරසාර තෙතමන සංරක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම.

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් ගසේ වර්ධනයට හා විභව අස්වැන්නක් ලබාදීම සඳහා ශාකයේ වර්ධක හා ප්‍රජනක අවධි යන දෙකෙහිදී ම පාංශු තෙතමනය අත්‍යාවශ්‍ය සාධකයකි. මේ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි කලාපවල පොල් වගාව සඳහා ජීව අඟුරු යොදා ගනිමින් තිරසාර පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රමයක් අධ්‍යයනය කිරීමයි. වියළි කලාපය නියෝජනය කරමින් පුත්තලම් දිස්ත්‍රික්කයේ රස්නායකපුර වතුයායේ වයස අවුරුදු 30ක් පැරණි පොල් ගස් යොදා ගනිමින් 2015 වර්ෂයේ මෙම පර්යේෂණය ආරම්භ කෙරිණි. ඔක්සිජන් සැපයුම අවම කරන ලද නවීකරණය කළ පෝරණුවක් තුළ ග්ලිරිසීරියා දඬු භාවිතයෙන් ජීව අඟුරු සාදන ලදී.

විද්‍යාගාර විශ්ලේෂණ දත්තවලට අනුව පොල් ලෙලිවලට සාපේක්ෂව ජීව අඟුරු කිලෝග්‍රෑම් 15ක් යොදා පිරියම් කරන ලද වළවල්වල පාංශු විද්‍යුත් සන්නායකතාව, තෙතමන සංරක්ෂණය සඳහා නිර්දේශිත පොල් ලෙලිවලට සාපේක්ෂව සෙන්ටිමීටර් 0-15 සහ සෙන්ටිමීටර් 15-30 ගැඹුරකදී පිළිවළින් 44% සහ 72% සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණි.පසෙහි කාබන් අන්තර්ගතය පොල් ලෙලි ප්‍රතිකාරයේ 0.53% ක් වූ



අතර කිලෝග්‍රෑම් 15ක් ජීව අඟුරු ප්‍රතිකාරකයේ 0.55% ක් විය. 2019 හා 2020 වසරවලදී කිලෝග්‍රෑම් 15 ක් ජීව අඟුරු යෙදූ ප්‍රතිකාරකයේ ගෙඩි අස්වැන්නේ සාමාන්‍යය ගසකට/ අවුරුද්දකට/ ගෙඩි 83 ක් සහ 69 ක් වශයෙන් ඉහළ අගයක් නිරීක්ෂණය විය. ක්ෂේත්‍රයේ ප්‍රතිකාර යොදා වසර 4කට පසුත් ඉහළ සැලකිය යුතු පාංශු තෙතමනයක් (4%) නිරීක්ෂණය වූයේ ජීව අඟුරු කිලෝග්‍රෑම් 15 ක් හා කිලෝග්‍රෑම් 10 ක් යෙදූ ප්‍රතිකාරවල සෙන්ටිමීටර් 0-15 දක්වා වූ මට්ටමේදී ය. ජීව අඟුරු කිලෝග්‍රෑම් 05ක් හා පොල් ලෙලි යෙදූ ප්‍රතිකාරවල පාංශු තෙතමන ප්‍රමාණයන් සැලකිය යුතු වෙනසක් දක්නට නොවීය.



පොල් වගාව කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම

පොල් ඵලදාවේ වෙනස්වීමට පවතින දේශගුණික තත්ත්වයන්ගේ බලපෑම.

ශාක කායික විද්‍යා අංශය

මුළු දිවයින පුරා විසිරී ඇති පොල් වතු 900කට වඩා වැඩි ප්‍රමාණයකින් ලබා ගත් දත්ත ඇසුරින් 2020 වසර සඳහා ජාතික පොල් නිෂ්පාදනය ගණනය කරන ලදී.ඒ අනුව 2020 වසරෙහි ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2818.3ක් විය. මෙය වැඩිම පොල් නිෂ්පාදනයක් වාර්තා වූ වර්ෂයන්ගෙන් එකක් වන 2019 වසරේ ජාතික පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන 3106.4) සමඟ සසඳන විට 9ක පමණ අඩු වීමකි. 2020 වසරේ නිරීක්ෂිත ඵලදා වෙනස්වීමේ රටාව සාමාන්‍ය රටාව හා සසඳන විට යම් සමානතාවයක් පෙන්නුම් කර ඇති අතර තුන්වන මුරයේදී (මැයි/ජුනි) ඉහළ අගයක් (ගෙඩි මිලියන 553.1) පෙන්නුම් කරයි. සෑම මුරයකම පොල් නිෂ්පාදනය 2019 වසරට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි.

2020 වසරේ ජාතික පොල් නිෂ්පාදනය එම වසර සඳහා පුරෝකථන කළ අගයට (2708.2 ± 25.6) වඩා 4% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර එම අගය පිළිගත හැකි සීමාවක පවතී.





(a) 2020 වසර සඳහා පුරෝකථනය කළ ද්වීමාසික ඵලදාව හා අදාළ කාල වකවානු සඳහා ඇස්තමේන්තු ගත පොල් ඵලදාව අතර සංසන්දනය සහ
(b) 2020 වසරේ ජාතික පොල් නිෂ්පාදනය 2019 අදාළ අගයන් සමඟ සංසන්දනය

2021 පොල් ඵලදාව පුරෝකථනය

ශාක කායික විද්‍යා අංශය

ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශයන් වන කුරුණෑගල, කුලියාපිටිය, ගම්පහ සහ පුත්තලම සඳහා 2020ට සාපේක්ෂව 2021 වසරේ එක් ගසක පොල් ඵලදාවෙහි අපේක්ෂිත වෙනස, ස්ථාවර වූ බැට්ටා සංඛ්‍යාව මත පදනම්ව පුරෝකථනය කරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්ක අනුව ඵලදාව (අගෝස්තු දක්වා) සැලකූ විට කුරුණෑගල, පුත්තලම, සහ ගම්පහ දිස්ත්‍රික් වල පිළිවෙලින් 17%, 5%, 26%, ක ඵලදාවේ වැඩි වීමක් පෙන්නුම් කරයි. ඒ අනුව 2021 (අගෝස්තු දක්වා) එක් මුරයක් සඳහා පුරෝකථනය කළ ඵලදාව ජනවාරි/පෙබරවාරි (1වන මුරය) ගෙඩි මිලියන 529.4 ± 22.9, මාර්තු/අප්‍රියෙල් (2වන මුරය) ගෙඩි මිලියන 546.9 ± 32.7, මැයි/ජුනි (3වන මුරය) ගෙඩි මිලියන 684.5 ± 38.0 සහ ජූලි/අගෝස්තු (4වන මුරය) ගෙඩි මිලියන 624.8 ± 35.4 වේ. ඒ අනුව 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා අපේක්ෂිත මුළු ඵලදාව ගෙඩි මිලියන 2385.6 ± 32.3 වේ. ඒ අනුව 2021 වසරේ පළමු මාස 08 සඳහා ජාතික පොල් නිෂ්පාදනය 2020 එම කාල සීමාවට සාපේක්ෂව 19% ක වැඩිවීමක් අපේක්ෂා කෙරේ.



2020 වසරේ ද්වීමාසික ඵලදාව (අගෝස්තු දක්වා) 2021 වසරේ එම කාලය සඳහා අපේක්ෂිත ද්වීමාසික ඵලදාව සමඟ සංසන්දනය.

බීජ පොල් පැළ නැවත සිටුවීමේදී ඇතිවන ජල ආතතිය අඩු කිරීමට යෙදිය හැකි ප්‍රතිඋත්ස්වේදකාරක (Antitranspirants) පිළිබඳ මූලික අධ්‍යයනය

ශාක කායික විද්‍යා අංශය

දැනට වගා බිමෙහි අලුතින් සිටුවන ලද බීජ පොල් පැළ 40% කට ආසන්න ප්‍රමාණයක් ජලය අඩුකම හේතුකොට ගෙන විනාශ වේ. මුල් අවධියේ බීජ පොල් පැළ වල පත්‍ර මත ප්‍රතිඋත්ස්වේදකාරක යෙදීම මගින් උත්ස්වේදනය පාලනය කිරීමටත් එමඟින් ප්‍රමාණවත් තරම් ජලය ප්‍රමාණයක් ශාකයේ රඳවා ගැනීමටත් හැකියාව ලැබේ.

පොල් පැළ සඳහා ඵලෙස යෙදිය හැකි ප්‍රතිඋස්වේදකාරක පිළිබඳ සොයා බැලීමේ අරමුණින් මෙම පරීක්ෂණය සැලසුම් කරන ලදී.මේ සඳහා ප්‍රතිඋත්ස්වේදකාරක හතරක් (Kaolin, $CaCO_3$, $MgCO_3$ සහ MOP) සාන්ද්‍රණ දෙකකින් (3% බර /පරිමාව, 9% බර/පරිමාව) යොදා ගන්නා ලදී.

ප්‍රමාණවත් සාන්ද්‍රණ මට්ටම් නොමැති වීම හෝ සමහර යාන්ත්‍රික දෝෂ නිසා මෙම ප්‍රතිඵල පරාමිතීන් අතර සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය කළ නොහැකි විය. එම නිසා මෙම පරීක්ෂණය ඉහත ප්‍රතිඋත්වේදකාරකයන් හතර වෙනත් සාන්ද්‍රණ තුනක් (3% බර /පරිමාව, 5% බර/ පරිමාව සහ 7% බර පරිමාව) යොදා ගනිමින් නැවත සිදුකිරීමට තීරණය කරන ලදී.



රූපය 1: පත්‍ර මත ප්‍රතිඋත්ස්වේදකාරක යෙදීම

ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා පර්යේෂණාත්මක සැලසුම් ප්‍රශස්තිකරණය

ශාක කායික විද්‍යා අංශය

වසර ගණනාවක් පුරා පර්යේෂණ මගින් රැස් කරන ලද දත්ත විශ්ලේෂණ ක්‍රම වේදයන්හි නිරවද්‍යතාවය ඉහළ නැංවීම සඳහා කරන ලද අධ්‍යයනයකි. මේ සඳහා යොදා ගත් සංඛ්‍යාත්මක ක්‍රමවේදයන් වූයේ, පුනරාවර්ත සහ විචලතා විශ්ලේෂණය (Repeated Measures ANOVA), රේඛීය මිශ්‍ර ආදර්ශය (Mixed Model) සහ පරායත්ත විචල්‍යය ලෙස ප්‍රධාන සංරචකය භාවිතා කරමින් කරන ලද සහවිචලතා විශ්ලේෂණයයි (ANOVA with Principal Components as dependent variables). ලද ප්‍රතිඵල අනුව, පරායත්ත විචල්‍යය ලෙස ප්‍රධාන සංරචකය භාවිතා කරමින් කරන ලද සහවිචලතා විශ්ලේෂණ ක්‍රමය මෙවැනි දත්ත විශ්ලේෂණය සඳහා වඩාත්ම නිරවද්‍ය ක්‍රමවේදය බව තහවුරු විය.



විවිධ විශ්ලේෂණ ක්‍රම වලින් ලද ප්‍රථිඵල සංසන්දනය

(විචලතා සංගුණකය ප්‍රතිශතයක් ලෙස)



වගා සංරක්ෂණය

ශ්‍රී ලංකා උස සහ ශ්‍රී ලංකා කුන්දිරා විදේශීය ප්‍රභේද සමඟ දෙමුහුම් කිරීමෙන් පොල් මයිටා හානියට දක්වන ප්‍රතිරෝධීතාවය / පාත්‍රීතාවය ඇගයීම.

වගා සංරක්ෂණ අංශය

මෙම පරීක්ෂණය සිදු කරන ලද්දේ අග්නිදිග ආසියාතික හා පැසිෆික් සම්භවයකින් යුතු පරාග සහිත නව පොල් දෙමුහුම් ප්‍රභේද පොල් මයිටාවන්ගේ හානියට දක්වන ප්‍රතිරෝධීතාවය පාත්‍රීතාවය ඇගයීම සඳහාය. ආනයනය කරන ලද පොල් ප්‍රභේද 4ක පරාග [මලයානු රතු කුන්දිරා (MRD), ටැග්නනාන් උස (TAGT), බ්‍රසීලියානු කොළ කුන්දිරා (BGD), සහ රෙනල් අයිලන්ඩ් උස (RIT)], ශ්‍රී ලංකා උස (T), ශ්‍රී ලංකා කොළ කුන්දිරා (DG) හා සැන්රාමන් (SR) ප්‍රභේද අතර දෙමුහුම් අධ්‍යනය කරන ලදී.

COVID 19 හේතුවෙන් රට වසා දැමීම නිසා ඵලදාවෙහි දත්ත රැස් කිරීමට හැකි වුයේ අවස්ථා 6කදී පමණි. ප්‍රතිඵලවලට අනුව ශ්‍රී ලංකා උස x බ්‍රසීලියානු කොළ කුන්දිරා (TxBGD) දෙමුහුම් ප්‍රභේදයේ ගෙඩිවල අඩු ම පොල් මයිටා හානිය පෙන්වන ලදී (සටහන 1).



රූපය 1: දේශීය ප්‍රභේද හා අග්නිදිග ආසියානු හා පැසිෆික් සම්භවයක් සහිත දර්ශවල පරාග දෙමුහුම් කිරීමෙන් ගත් පොල් ප්‍රභේදවල පොල් මයිටා හානියේ ප්‍රතිශතය

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) හා කොළ කරවීමේ ආබාධය (LSD) හා සම්බන්ධ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍යවල වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේද මඟින් හඳුනා ගැනීම

වගා සංරක්ෂණ අංශය

මෙම අධ්‍යනය සිදු කරන ලද්දේ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) හා කොළ කරවීමේ ආබාධය හා සම්බන්ධ ප්‍රෝකැරියෝටාවන් අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේද මඟින් හඳුනා ගැනීම සඳහාය. පොල් ශාකයේ පටක සාම්පල වට දෙකකින් ලබා ගත් අතර බහු අවයවික දාම ප්‍රතික්‍රියාව (PCR) සඳහා භාජනය කරන ලදී. WCLWD රෝගී ලක්ෂණ සහිත සහ බාහිර ව නිරෝගී ලෙස පෙනෙන රෝග ලක්ෂණ නොමැති පොල් ගස්වලින් නිවැරදි ව ෆයිටෝප්ලස්මා හඳුනා ගැනීම සඳහා NESTED PCR ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සිදු කෙරිණි.

CTAB ක්‍රමවේදයෙන් සහ වාණිජමය DNA නිස්සාරණය කිරීමේ කට්ටලය (DNeasy-Plant Pro Kit-Qiagen) භාවිතයෙන් පොල් ගොබයේ ළපටි කොළ සාම්පලවල DNA නිස්සාරණය කිරීමේ කාර්යක්ෂමතාවය සංසන්දනය කරන ලදී. ඒ අනුව DNA අණුවල ගුණාත්මය හා ප්‍රමාණය Nanodrop උපකරණය මඟින් නිර්ණය කරන ලද අතර එම ප්‍රතිඵල පහත දැක්වේ .

වගු අංක 1: ඉහත ක්‍රම මඟින් නිස්සාරණය කරගත් DNA වල ප්‍රමාණය හා ගුණාත්මය සැසඳීම

සාම්පල අංකය	වාණිජමය නිස්සාරණය කිරීමේ කට්ටලය ක්‍රමවේදය		CTAB ක්‍රමවේදය	
	DNA ප්‍රමාණය නැනෝග්‍රෑම්/ මයික්‍රෝ ලීටර්	DNA ගුණාත්මය 260/280	DNA ප්‍රමාණය නැනෝග්‍රෑම්/ මයික්‍රෝ ලීටර්	DNA ගුණාත්මය 260/280
1	4.3	1.83	1280.40	1.79
2	2.1	1.54	596.50	1.76
3	2.9	2.09	487.70	1.67
4	4.1	2.23	801.00	1.79
5	4.9	1.88	1296.10	1.95

ඉහත ප්‍රතිඵලවලට අනුව වාණිජමය DNA නිස්සාරණය කිරීමේ කට්ටලයට වඩා CTAB ක්‍රමවේදය පොල් ගොබයේ ළපටි පත්‍රවල හොඳ තත්ත්වයේ DNA ලබා දෙන ලදී. එම නිසා ශාක සෛලයක ජාන කිටුවේ අඩංගු DNA අතර ව්‍යාධිජනක DNA ඉතා සුළු ප්‍රමාණයක් තිබිය හැකි බැවින් DNA නිස්සාරණය සඳහා CTAB ක්‍රමවේදය තෝරා ගැනිණි. පරීක්ෂාවට භාජනය කරන ලද පොල් ශාකවල පටක සාම්පල මඟින් PCR ධනාත්මක ප්‍රතිඵල ලැබුණේ ෆයිටෝප්ලස්මා සඳහා පමණි.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සහ ෆයිටෝප්ලස්මා අතර ඇති සම්බන්ධතාවය

බහු අවයවික දාම ප්‍රතික්‍රියා සහ එහි ප්‍රතිඵල ජාන අනුක්‍රමිකයට ලක් කෙරූ කළ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සහ ෆයිටෝප්ලස්මා අතර ඇති සබඳතාවය වසර ගණනාවකට පසු නැවත තහවුරු විය. එය උක් ගසේ පත්‍ර සුදු වීමේ රෝගයට බලපාන ෆයිටෝප්ලස්මාවගේ ජාන අනුක්‍රමිකයට 99-100% ගැලපිණි.

වගු අංක 2: පොල් ගසේ විවිධ පටකවල ෆයිටෝප්ලස්මා සඳහා PCR ධන වීමේ ප්‍රතිශතය

සාම්පල වර්ගය	පටක වර්ගය	සාම්පල ගණන	ධන සාම්පල ගණන	PCR ධන වීමේ ප්‍රතිශතය
WCLWD රෝග ලක්ෂණ සහිත පොල් ගස්	පොල් ගොබයෙන් ලබා ගන්නා ළපටි කොළ	12	9	75%
	ළපටි පුෂ්ප මංජරිය	12	3	25%
	ගසේ මුල	12	5	41%
WCLWD රෝග ලක්ෂණ නොමැති පොල් ගස්	පොල් ගොබයෙන් ලබා ගන්නා ළපටි කොළ	12	10	83%
	ළපටි පුෂ්ප මංජරිය	12	2	16%
	ගසේ මුල	12	3	25%

කළු කුරුමිණින්ගේ ගහනයේ වෙනස්වීම, *Oryctes rhinoceros*

වගා සංරක්ෂණ අංශය

කළු කුරුමිණි ගහනයේ මාසික විචල්‍ය රටා අධ්‍යනය කිරීම සඳහා ආරම්භ කරන ලද පර්යේෂණය 2020 වසර තුළදී ද සිදු කරන ලදී. නමුත් COVID 19 හේතුවෙන් කිහිපවාරයක් රට වසා දැමුණු බැවින් යම් මාසවල දත්ත එකතු කිරීමට නොහැකි වූ අතර එමනිසා, 2019 වර්ෂයේ මෙන් ගහනයේ විචල්‍ය රටා නිරීක්ෂණය කිරීමට නොහැකි විය. එහෙත් , තෙත් කලාපයේ ඉහළ ගහනයත් (මසකට එක උගුලකට කුරුමිණි 21ක්), වියළි කලාපයේ එක උගුලකට මසකට කුරුමිණි 17.3ක් හා අතරමැදි කලාපයේ එක උගුලකට මසකට කුරුමිණි 12.8 ක් වූ අතර හසුවූ කළු කුරුමිණියන්ගේ මධ්‍යන අගය එම වසරේ 5 සිට 54 දක්වා වෙනස් විය. මාර්තු මස හැර , සෑම කෘෂි දේශගුණික කලාපයකම හසු වූ කුරුමිණියන්ගෙන් 60%ක් ගැහැණු සතුන් වූ අතර ලිංගික අනුපාතය 1:1.5ක් විය.

පොල් වගාවන්වල පළිබෝධකයන් පැතිරීම.

වගා සංරක්ෂණ අංශය

පොල් වගා කරන ප්‍රදේශ වන කුරුණෑගල , කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්කවල 2020 වසරේ මාර්තු මස සිට කහ තිත් පළගැටියන් *(Aularches miliaris)* (රූපය-1) පැතිරීම වාර්තා විය. වැඩියෙන්ම හානි වුයේ ගෙවතු වගාවල හා වනාන්තරවලට මායිම් ව තිබූ පොල් වගාවන්ටය. පැතිරෙන අවස්ථාවේදී වගාවන්වල ශිශුවන් පමණක් සිටි අතර එම නිසා පොල් පැළ පමණක් හානි විය. පැතිරීම ස්වාභාවිකවම වළක්වා ගත හැක්කේ ශිශු අවධිය සුහුඹුලන් බවට පත් වීමට පෙරය. සුහුඹුලා යනු මේරූ පොල් ගස්වලට හානි කරන අවධියයි . සමහර ස්ථානවල උග්‍ර පැතිරීම පාලනය කරන ලද්දේ කාබෝසල්ෆාන් මිලි ලීටර් 05ක් ජලය ලීටර් 01ක අනුපාතයට ඉසීමෙනි.



රූපය 1 : කෑගල්ල දිස්ත්‍රික්කයේ පොල් අතු මත සිටින කහ තිත් පළඟැටියන්

2019 වසරේ අග භාගයේ සුදු මැස්සන් කෑගල්ල, කුරුණෑගල, ගම්පහ, රත්නපුර, මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල ව්‍යාප්ත විය . කෑගල්ල, කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කවල යම් වගාවන්වල උග්‍ර ව්‍යාප්තියක් වාර්තා විය (රූපය 2). ක්ෂේත්‍රයෙන් රැස් කරගන්නා ලද සාම්පලවලින් අවම වශයෙන් සුදු මැස්සන් විශේෂ 3ක් වාර්තා වූ අතර ඉතා අඩු ස්වාභාවික ජෛව පාලකයන් සිටින බව පෙනිණි. පොල්, තැඹිලි හා වෙනත් ශාක වර්ග වන පේර, මිරිස්, කෙසෙල්, කිතුල්, කොට්ටම්බා, අඹ හා කොස් වල උග්‍ර සුදු මැස්සන් ගහනයක් නිරීක්ෂණය විය (රූපය 3). උග්‍ර අසාදනවලදී කළටි පොල් ගෙඩි පවා සුදු මැස්සන්ගේ ආක්‍රමණයට ලක් වේ (රූපය 4).

මේ සඳහා අතුරු නිර්දේශ ලෙස කාබෝසල්ෆාන් හෝ තයෝමෙතොක්සම් හෝ තයෝ-මෙතොක්සම් + ක්ලොරන්ට්‍රනිලිප්‍රෝල් ඉසීම නිර්දේශ කරනු ලබයි.



රූපය 2 : කැගල්ල දිස්ත්‍රික්කයේ පොල් පත්‍රිකා මත සිටින සුදු මැස්සන්



රූපය 3 : කැගල්ල දිස්ත්‍රික්කයේ කෙසෙල් පත්‍ර මත සිටින සුදු මැස්සන්



රූපය 4 : සුදු මැස්සන් ආසාදිත ළපටි පොල් ගෙඩි



පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම

පොල් බටර් නිෂ්පාදනය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

මීට පෙර නිෂ්පාදනය කරන ලද පොල් බටර් තැවරුම සඳහා තවදුරටත් වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී. විජලනය කළ පොල්, සීනි, රටකජු, ලුණු ස්ථායීකාරක (සෝඩියම් කැසිනේට් සහ සෝඩියම් ස්ටෙරොයිල් ලැක්ටේට්) සහ විටමින් E යන අමුද්‍රව්‍ය භාවිතා කරන ලදී. ප්‍රතිඵලවලින් පෙන්නුම් කළේ තවදුරටත් වැඩි දියුණු කිරීම් අවශ්‍ය බවයි.

පොල්වල අද්විතීය ස්වාදය, වර්ණය සහ රසය සහිත පොල් බටර් තැවරුමෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යයනය දිගම කරගෙන යන ලදී. ස්ථර වෙන්වීම වැළැක්වීම සඳහා, ස්ථායිකාරක සහ තෙලෝදකාරක ලෙස පෙක්ටීන් සහ සෝයා ලෙසිතින් මට්ටම් දෙකකින් (0.5% සහ 1% එකතු කරන ලදී. පෙක්ටීන් එකතු කිරීමට සාපේක්ෂව සෝයා ලෙසිතින් එකතු කිරීම මඟින් පොල් බටර් තැවරුමෙහි ස්ථර වෙන් කිරීම අඩු විය. නිෂ්පාදනය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වැඩිදුර අධ්‍යයනය කරනු ලැබේ.)



රූපය 1 : පොල් බටර් තැවරුම

මේද රහිත පොල් කිරි භාවිතයෙන් සකසන ලද චීස් තැවරුම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

නැවුම් පොල්තෙල් නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන මේද රහිත විජලනය කළ පොල් මදවලින් සාන්ද්‍රණය කරන ලද පොල් ප්‍රෝටීන් යොදාගනිමින් නිෂ්පාදනය කරන ලද චීස් තැවරුම පිළිබඳ අධ්‍යයනයන් තවදුරටත් සිදු කරන ලදී. පොල් ප්‍රෝටීන්, සිට්‍රික් අම්ලය, ඉරිඟු පිෂ්ඨය (CS) පෝෂණ යීස්ට් (NY) සහ ලුණු යන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම සාධක තුනකින් යුත් ක්‍රමාරෝපිත සැකැස්මට අනුව සිදු කරන ලදී. සුදුසු දෘඩතාවයක් සහිත නිෂ්පාදනයක් තෝරා ගැනීමට නිෂ්පාදනයේ දෘඩතාව නිර්ණය කරන ලදී. පාලකයක් ලෙස වාණිජ චීස් භාවිතා කරන ලදී. සංඛ්‍යානාමය විශ්ලේෂණයේ ප්‍රතිඵලවලින් හෙළි වූයේ, නිෂ්පාදනයේ දෘඩතාව සඳහා ඉරිඟු පිෂ්ඨය, පෝෂණ යීස්ට් සහ ලවණ යන විවිධ සාධක තුනක් අතර සැලකිය යුතු අන්තර්ක්‍රියාවක් ($p<0.05$) ඇති බවයි. තවදුරටත් වැඩි දියුණු කිරීම් සඳහා අඩු දෘඩතාවයක් සහිත නිෂ්පාදනයක් තෝරාගෙන ඇති අතර සමාන දෘඩතාව සහිත සාම්පල 25 දෙනෙකු සමඟ සංවේදී ඇගයීමකට ලක් කරන ලදී.

සාම්පල C හා D සමඟ සැසඳීමේ දී සාම්පල A සහ B (වගුව 1) සඳහා සැලකිය යුතු ඉහළ සමස්ත පිළිගැනීමක් සහ රසයක් පැවතුණි. එබැවින් සිට්‍රික් අම්ලය භාවිතයෙන් වෙන් කරන ලද පොල් ප්‍රෝටීන්, පොල් ආශ්‍රිත චීස් තැවරුම නිෂ්පාදනය සඳහා සාර්ථක ලෙස යොදා ගත හැක. තවද, ලුණු 5%, ඉරිඟු පිෂ්ඨය 4-6%, පෝෂණ යීස්ට් 2-2.5% සමඟ දෘඩතාව 2.51-2.78N චීස් සාම්පල සඳහා හොඳ පිළිගැනීමක් පෙන්නුම් කළේ ය. සිට්‍රික් අම්ලය වෙනුවට ලැක්ටික් අම්ලය භාවිතයෙන් තවදුරටත් වැඩි දියුණු කිරීම් සිදු කරනු ලැබේ.

වගුව: 01

අඩු මේද සහිත පොල් කිරිවලින් නිපදවන චීස් වල සංවේදී ගුණය සඳහා ෆීඩ්මන් ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණ ප්‍රතිඵලය.

නියදි	සුවඳ	රස	පෙනුම	වයනය	සමස්ත පිළිගැනීම
(A)ලුණු 5% , ඉරිඟු පිෂ්ඨය 4% පෝෂණ යීස්ට් 2.5%, සමඟ දෘඩතාව 2.78N	66.5[a]	72[a]	66[a]	73[a]	74[a]
(B) ලුණු 5% , ඉරිඟු පිෂ්ඨය 6% පෝෂණ යීස්ට් 2%, සමඟ දෘඩතාව 2.51N	63.5[a]	72[a]	66.5[a]	71[a]	71.5[a]
(C) ලුණු 5% , ඉරිඟු පිෂ්ඨය 6% , පෝෂණ යීස්ට් 2.5% සමඟ දෘඩතාව 2.82N	63.5[a]	53[b]	60[a]	53.5[b]	52[b]
(D) ලුණු 7% , ඉරිඟු පිෂ්ඨය 6% පෝෂණ යීස්ට් 2.5% සමඟ දෘඩතාව 2.92N	56.5[a]	53[b]	57.5[a]	52.5[b]	52.5[b]

සුපර්ක්‍රිප්හි විවිධ අකුරු $P<0.05$ හි ප්‍රතිකාර අතර සැලකිය යුතු අන්තර් ක්‍රියාවක් පෙන්නුම් කරයි.

පොල් ප්‍රෝටීන් සාන්ද්‍රවලින් සකසන ලද ජෛව හායනයට ලක්විය හැකි ඇසුරුම්

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනයෙන් ලැබෙන අතුරු ඵලයෙන් සාන්ද්‍ර කරගත් පොල් ප්‍රෝටීන්වලින් ජෛව හායනයට ලක්විය හැකි පටල සකස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ආහාරයට ගතහැකි පටල සෑදීම සඳහා ඉරිඟු පිෂ්ඨයට (CS) වඩා පොල් ප්‍රෝටීනයේ (CP) ඇති ශක්තීන් සහ දුර්වලතා විමර්ශනය කරන ලදී. ප්‍රශස්ත pH අගය, ඉරිඟු පිෂ්ඨය: පොල් ප්‍රෝටීන් අනුපාතය සහ Poly Ethylene Glycol (PEG) මට්ටම හඳුනා ගැනීම සඳහා පටලවල ඉදිමීම් දර්ශකය, ආලෝකය සම්ප්‍රේෂණය සහ පාරාන්ධතාව ඇගයීමට ලක්කරන ලදී.

ඉරිඟු පිටි සහ පොල් ප්‍රෝටීන් පමණක් සහිත පටල සතුටුදායක වූ අතර ඒවායෙහි සමජාතීය සහ නම්‍යශීලීබව නිරීක්ෂණය විය. pH 8.5 සහ 2.5% PEG සහිත CP වලින් පමණක් සාදන ලද පටලය සඳහා 483.96 ± 13.76% ක උපරිම ඉදිමීම් දර්ශකයක්, නිරීක්ෂණය කරන ලද අතර pH 9.5 සහ PEG එකතු කිරීමකින් තොරව CS වලින් පමණක් සාදන ලද පටලය සඳහා අවම ඉදිමීම් දර්ශකය 14.31 ± 4.47% නිරීක්ෂණය කරන ලදි. ජෛව හායනයට ලක්විය හැකි පටලවල ඉදිමීම් දර්ශකය, ද්වි-මාර්ග අන්තර්ක්‍රියාවල (PEG*CS, PEG*pH සහ CS*pH)($P<0.05$) සැලකිය යුතු බලපෑමක් ඇති විය.

පරීක්ෂා කරන ලද සියලුම පටලවල 0-200nm UV පරාසයක ආලෝක සම්ප්‍රේෂණය සඳහා විශිෂ්ට බාධකයක් විය. තරංග ආයාමයත් සමඟ පටලවල ආලෝක සම්ප්‍රේෂණය ද වැඩි විය. PEG හි 2.5% එකතු කිරීමත් සමඟ pH 9.5 යටතේ CP පමණක් සහිත පටල සඳහා පාරාන්ධතාව ඉහළම අගය (5.28 ± 0.21) ලබා ගන්නා ලද අතර PEG එකතු කිරීමකින් තොරව pH 8.5 යටතේ CS පටල සඳහා අඩුම පාරාන්ධතාව (2.14 ± 0.16) ලබා ගන්නා ලදී. CP පමණක් සහිත පටවල පාරාන්ධතාව CS පටලවලට වඩා වැඩි විය. තවද ඉරිඟු පිෂ්ඨය සහ පිරිසිදු පොලිඑතිලීන් හා සසඳන විට පොල් ප්‍රෝටීන් සහිත පටලය ඉහළ ජෛව හායනය පෙන්නුම් කරයි. (රූපය 1)

පටල වර්ගය	පටල පස් මිශ්‍ර කිරීමට පෙර	පටල පස් මිශ්‍ර කිරීමෙන් දින 03 පසු	පටල පස් මිශ්‍ර කිරීමෙන් දින 07 පසු
CP පටලය 8.5 pH 0 % PEG		 ආංශික ජෛව හායනය	 සම්පූර්ණ ජෛව හායනය

CS පටලය 8.5 pH 0 % PEG		 ජෛව හායනය දැන් ආරම්භ වෙමින් පවතී.	 ආංශික ජෛව හායනය
පිරිසිදු පොලිඑතිලීන් පටලය		 සැලකිය යුතු ජෛව හායනයක් නොමැත.	 සැලකිය යුතු ජෛව හායනයක් නොමැත.

රූපය 1: විවිධ ඇසුරුම් පටලවල ජෛව හායනය

සාම්ප්‍රදායික ක්‍රමයට එකතු කරන ලද පොල් යුෂවලින් සාදන ලද පොල් හකුරුවල ග්ලයිසිමික් දර්ශකය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

ආහාරවල ග්ලයිසිමික් දර්ශකය, සංයුතිය සහ එය සැකසීමේ ක්‍රමය අනුව වෙනස් විය හැක. පොල් යුෂවලින් සාදන ලද පොල් හකුරුවල ග්ලයිසිමික් දර්ශකය නිර්ණය කිරීම සඳහා අධ්‍යයනය අඛණ්ඩව සිදු කරන ලදී. නවීකරණය කරන ලද උපකරණයක් භාවිතයෙන් එකතු කරන ලද පොල් යුෂවලින් සාදන ලද පොල් හකුරුවල ග්ලයිසිමික් දර්ශකය පසුගිය වසරේ ගණනය කරන ලදී. සාම්ප්‍රදායික ක්‍රමයට අනුව මීරා පැසවීම නැවැත්වීම සඳහා පොල් යුෂ එකතු කරන මුට්ටිවලට හල් පොතු එකතු කිරීම සාම්ප්‍රදායික ක්‍රමය වේ. හකුරු සෑදීම සඳහා මීරා යුෂ එකතු කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය මෙයයි. අධ්‍යයනය සඳහා ආචාරධාර්මික අනුමැතිය ශ්‍රී ලංකාවේ ජාතික රෝහල් අචාරධර්ම මණ්ඩලයෙන් ලබා ගන්නා ලදී. සාම්ප්‍රදායික ක්‍රමයට එකතු කරන ලද නොපැසුණු පොල් යුෂ භාවිතයෙන් හකුරු සකස් කරන ලදී. හකුරුවල ඇති සම්පූර්ණ පිෂ්ඨය, ප්‍රතිරෝධී පිෂ්ඨය සහ දිරවිය හැකි පිෂ්ඨය වැනි අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත in-vitro enzymatic digestion ක්‍රමය භාවිතයෙන් තීරණය කරන ලදී. හකුරුවල ඇති සම්පූර්ණ පිෂ්ඨය, ප්‍රතිරෝධී පිෂ්ඨය සහ දිරවිය හැකි පිෂ්ඨය පිළිවෙළින් 83,43, 0.45 සහ 82,98% විය.

සදාචාරාත්මක නිෂ්කාශන මණ්ඩලයේ අනුමැතියට අනුව පරීක්ෂා කරන ලද මානව විෂයයන් 40 ක් භාවිතා කරන සායනික අධ්‍යයනය සම්පූර්ණ කරන ලදී.

කොහු නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම: රබර් සපත්තු නිෂ්පාදනයේ අමුද්‍රව්‍ය ලෙස පොල් ලෙලි කෙඳි පොල් ලෙලි නිෂ්පාදන ඇතුළත් කර සුව පහසු අත්වැසුම් සහ රබර් සපත්තු නිෂ්පාදනය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

ශරීරයේ ආරක්ෂාව සඳහා රබර් සපත්තු සහ අත්වැසුම් භාවිතා වේ. කෙසේ වෙතත් උණුසුම්, නිවර්තන දේශගුණික තත්ත්වයන් තුළ දහඩිය දැමීම හේතුවෙන් මෙම භාණ්ඩ පැළඳීම අපහසුය. අඩු බර, ජල ප්‍රතිරෝධය සහ අඩු තාප සන්නායකතාවය හේතුවෙන් ස්වාභාවික රබර් කොහු මිශ්‍රණ සංයුක්තය සහිත නිෂ්පාදන ජනප්‍රිය වෙමින් පවතී. එබැවින්, කොහුබත් සහ ස්වාභාවික රබර් මිශ්‍ර කර දහඩිය අඩු, සැහැල්ලු බූට් සහ අත්වැසුම් නිෂ්පාදනය කිරීම මඟින් ආරක්ෂිත සපත්තු සහ අත්වැසුම් සුවපහසු ලෙස භාවිතා කිරීමට මඟ සලසයි.

රබර් පොලිමර් සංයුක්ත මිශ්‍රණයට කොහු තන්තු එක් කිරීමෙන් එහි ආතන්‍ය ශක්තිය අඩු වූ අතර, කොහු තන්තු ප්‍රමාණය වැඩි වීමත් සමඟ ජල අවශෝෂණය වැඩි වන බව පෙර අත්හදා බැලීම්වලින් හෙළි විය. මෙම නිරීක්ෂණය ආරක්ෂිත සපත්තු සඳහා ධනාත්මක සාධකයකි. කොහු:කළු කාබන් 20:30 අනුපාතයෙන් එක් කළ විට මධ්‍යස්ථ ජල අවශෝෂණයක් සහ 13±1MPa ක ආතන්‍ය ශක්තියක් පෙන්නුම් කරන අතර, මෙම නිෂ්පාදන තත්ත්ව තවදුරටත් වැඩි දියුණු කළ යුතුය.

ආරක්ෂිත උපාංග ලෙස අත්වැසුම් භාවිතා කරයි. අඩු ආතන්‍ය ශක්තිය සහ දහඩිය දැමීමේ ස්වභාවය සංයුක්ත රබර් කිරිවලින් සාදන ලද අත්වැසුම් සම්බන්ධ ප්‍රධාන දෝෂ වේ. රබර් කිරිවලින් නිපදවූ අත්වැසුම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා කොහුබත්වලට ඇති හැකියාව කොහුබත් සමඟ සංයෝග කළ රබර් කිරි මිශ්‍රණ භාවිතයෙන් විමර්ශනය කරන ලදී. කොහු රබර් සංයුක්ත ස්ථරයේ අනුකූලතාව සඳහා කොහුබත් (විෂ්කම්භය 0-0.5mm) කුඩා ප්‍රමාණයකින් එකතු කළ යුතු බව මූලික පරීක්ෂණයෙන් පෙන්නුම් කෙරිණි. සම්මත රබර් අත්වැසුම් සෑදීමේ සූත්‍රයට මිලිමීටර් 0-0.5 ක විෂ්කම්භයක් ඇති කොහුබත් 2 g සහ 4 g එකතු කිරීමත් සමඟ ශක්ති ගුණාංගවල බලපෑම අධ්‍යයනය කරන ලදී.

ප්‍රතිඵල පෙන්නුම් කළේ සම්මත නිෂ්පාදනය (26± 1.02MPa) සහ 2g කොහුබත් (21.36±0.52MPa) සහිත නිෂ්පාදනයට සාපේක්ෂව 4g කොහුබත් සහිත නිෂ්පාදනයේ ආතන්‍ය ශක්තිය ඉතා අඩු (14.8 ± 0.20MPa) බවයි. එබැවින්, කොහුබත් සමඟ ඒකාබන්ධ රබර් අත්වැසුම් නිෂ්පාදනය කිරීම සඳහා 2 ට කොහුබත් සහිත සූත්‍රය පිළිගත හැකිය.

විසරණකාරක භාවිතයෙන් ආතන්‍ය ශක්තිය වැඩි දියුණු කළ හැකිය. එබැවින් රබර් කිරිවල කොහුබත් විසරුම එනම් dispersol LR ඇතුළත් කර අත්හදා බැලීමක් සිදු කරන ලදී. ප්‍රතිඵල පෙන්නුම් කළේ dispersol LR එකතු කිරීම මඟින් 2g කොහුබත් නිෂ්පාදනයේ ආතන්‍ය ශක්තිය 21.36±0.52MPa සිට 22.19±0.03MPa දක්වා වැඩි දියුණු වූ බවයි. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර අධ්‍යයනයන් සිදු කරනු ලැබේ.

මේද රහිත පොල් කුරුටු පිටි එකතු කරන ලද රොටී නිෂ්පාදනය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් කුරුටු යනු දිසිදි පොල්, පොල් කිරි සහ නැවුම් පොල්තෙල් කර්මාන්තවලින් ලැබෙන ඌන භාවිත අතුරු නිෂ්පාදනයකි. එය ආහාර සැකසුම් කර්මාන්තයේ ක්‍රියාකාරී අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීමේ හැකියාවක් ඇත. විජලනය වූ පොල් කුරුටු සීතල තෙරපුම් යන්ත්‍රයට දමා පොල් කුරුටු තෙල් සහ මේද රහිත පොල් කුරුටු ලබා ගත හැක. තෙල් රහිත පොල් කුරුටු සිහින් පිටිවලට අඹරනු ලැබේ. ඉවත් කරන ලද පොල් කුරුටු පිටි (TF) හි ආසන්න සංයුතිය 23.51% අශුද්ධ තන්තු, 32.80% කාබෝහයිඩ්‍රේට් සහ 16.97% මේදය වේ.

රොටී සකස් කිරීම සඳහා පොල් මදය ග්‍රෑම් 60 ක්, වතුර මිලි ලීටර් 30 ක් සහ ලුණු ග්‍රෑම් 3.5 ක් ද පිට්ටු සකස් කිරීම සඳහා පොල් මදය ග්‍රෑම් 60 ක්, වතුර මිලි ලීටර් 15 ක් සහ ලුණු ග්‍රෑම් 2 ක් ද සමඟ පිටිටු සකස් කිරීම සඳහා විවිධ ප්‍රමාණවලින් TF (10%, 20%, සහ 30%) තිරිඟු පිටි වෙනුවට ආදේශ කරන ලදී. තිරිඟු පිටිවලට (WF,TF) ඇතුළත් කර සාදා ගත් රොටී සාම්පලවල ඇති සියලුම සංවේදී ගුණාංග (රසය, භෞතික ස්වභාවය, පෙනුම, සුවඳ, සමස්ත පිළිගැනීම) සැලකිය යුතු ලෙස වෙනස් විය ($P<0.05$). සංවේදී ගුණාංග සමඟ පෝෂණ ගුණාංග වැඩිදියුණු කිරීම සඳහා පිරිපහදු කළ WF රොටී සහ පිට්ටු සමඟ TF 20% මට්ටම දක්වා සාර්ථකව සංයුක්ත කළ හැකිය. සංවේදී ගුණාංග සඳහා 10% සහ 20% TF තිරිඟු පිටි වෙනුවට ආදේශ කිරීමෙන් සැලකිය යුතු වෙනසක් ($P>0.05$) නොතිබුණි.



රූපය 1: පොල් කුරුටු පිටි එකතු කරන ලද රොටී සහ පිට්ටුවල සංවේදී ගුණාංග

පොල් කුරුටුවල දියවැඩියා විරෝධී බලපෑම්

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් ටෙස්ටා පිටිවල දියවැඩියා විරෝධී බලපෑම් සොයා බැලීමේ අධ්‍යයනය අඛණ්ඩව සිදු කරනු ලදී. ඔලිගොඩසැකරයිඩ සහ ඩයිසැකරයිඩ, මොනෝ-සැකරයිඩ බවට බිඳවැටීමට වගකිව යුතු එන්සයිම වන α - ඇමයිලේස් සහ α - ග්ලූකොසයිඩේස් අර්ධ වශයෙන් නිෂේධනය කිරීම හරහා දෙවන වර්ගයේ දියවැඩියාව කළමනාකරණය කළ හැකිය. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ α - ඇමයිලේස් සහ ග්ලූකෝසයිඩේස් එන්සයිමවල ආංශික නිෂේධනය කිරීමට, අර්ධ වශයෙන් මේදය ඉවත්කළ පොල් කුරුටුවලට ඇති හැකියාව තක්සේරු කිරීමයි. දේශීය පොල් වර්ග පහකින් ලබාගත් පොල් කුරුටු පිටි (CTF) සාම්පල හෙක්සේන්, එතිල් ඇසිටේට් සහ මෙතනෝල් සමඟ පිළිවෙලින් අනුක්‍රමිකව නිස්සාරණය කරන ලදී. CTF නිස්සාරණවල පද්ධතියෙන් බාහිරව (in-vitro) සිදු කළ α - ඇමයිලේස් පරීක්ෂාවට අනුව (IC_{50} ලෙස ඉදිරිපත් කර ඇත.) සියලුම ප්‍රභේදවල මේදය ඉවත්කළ පොල් කුරුටුවල මෙතනෝල් නිස්සාරක පමණක් ප්‍රබල α - ඇමයිලේස් නිෂේඨන ක්‍රියාකාරකම් පෙන්නුම් කළ අතර අනෙකුත් නිස්සාරණ දෙක අතර දුර්වල නිෂේධන ක්‍රියාකාරකම් නිරීක්ෂණය විය. Tall x Tall සහ San Ramon පොල් ටෙස්ටා පිටි මඟින් α - ඇමයිලේස් ක්‍රියාකාරකම් ප්‍රබල ලෙස නිෂේධනය කරන ලද අතර ගොන් තැඹිලි, රන් තැඹිලි සහ වාණිජ වගාව මඟින් පෙන්වූ ප්‍රබලතාව පිළිවෙලින් අනුක්‍රමිකව අඩු විය.

හෙක්සේන්, එතිල් ඇසිටේට් සහ මෙතනෝල්වල CTF නිස්සාරණයේ පද්ධතියෙන් බාහිරව (in-vitro) සිදු කළ α - ග්ලූකෝසයිඩේස් පරීක්ෂාව අනුව සියලුම ප්‍රභේදවල නිස්සාරණ α - ග්ලූකෝසයිඩේස්වලට එරෙහිව නිෂේධනීය ක්‍රියාකාරකම් ඇති බව පෙන්වන ලදී. විවිධ ප්‍රභේද ඔවුන්ගේ නිස්සාරණ තුළ IC_{50} අගයන්හි වෙනස්කම් පෙන්නුම් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ විභවයන්ගෙන් යුත් එන්සයිම නිෂේධන බලපෑම් ඇති බව පෙන්වන ලදී. ග්ලූකෝසයිඩේස් නිෂේධන ක්‍රියාකාරීත්වය සියලුම නිස්සාරණවල α - ඇමයිලේස් ක්‍රියාකාරීත්වය සඳහා වන නිෂේධනයට වඩා බෙහෙවින් ප්‍රබල බව සොයා ගන්නා ලදී.

පොල් කර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ සංවර්ධනය කිරීම

කොහු කර්මාන්තය සඳහා බ්‍රිස්ටල් කොහු කෙඳි නිස්සාරණය කිරීමේ යන්ත්‍රය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

සිලෝන් ඩ්‍රම් - Ceylon drum (Petti Kuttama - පෙට්ටි කුට්ටම) යනු ශ්‍රී ලංකාවේ බ්‍රිස්ටල් කොහු කෙඳි නිස්සාරණය සඳහා භාවිතා කරන සාම්ප්‍රදායික යන්ත්‍රයකි. සිලෝන් ඩ්‍රම් නිස්සාරකය හොඳම තත්ත්වයේ කොහු තන්තු නිපදවන නමුත්, ඉහළ නිපුණතා ඇති ශ්‍රමිකයන්ගේ අවශ්‍යතාව සහ ආරක්ෂිත ගැටලු වැනි අඩුපාඩු කිහිපයක් තිබේ. එබැවින් මෙම යන්ත්‍රය භාවිතා කිරීමට කම්කරුවන් මැලි වෙති. කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින් ආරක්ෂිත ගැටලු විසඳීම සඳහා පොල් ලෙලි කැවීමේ පද්ධතිය වැඩිදියුණු කරන ලදී. කෙසේ වෙතත්, අඩු නිෂ්පාදිතය සහ වැඩි දියුණු කරන ලද නිස්සාරකය විවිධ දිග ඇති පොල් ලෙලි ආදිය සඳහා භාවිතා කිරීමට නොහැකි වීම පිළිබඳව ප්‍රශ්න තවමත් නොවිසිඳී ඇත. එබැවින් පොල් පර්යේෂණ ආයතනය, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් දැනට පවතින ITI කොහු



රූපය 1 : සංවර්ධන අදියරේ කොහු නිස්සාරණ යන්ත්‍රය

කොහුබත් වියළීම සඳහා වියළුමක් සකස් කිරීම සහ සංවර්ධනය කිරීම.

පොල් සැකසුම් පර්යේෂණ අංශය

කොහුබත් වියළීම සඳහා වියළන යන්ත්‍රයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. පොල් ලෙලි උපස්ථර කර්මාන්තයට දැනට හිරු එළියෙන් කොහුබත් වියළන අකාර්යක්ෂම සහ අපිරිසිදු ක්‍රමයේ ගැටලු විසඳීම සඳහා යාන්ත්‍රික වියළුම් පද්ධතියක් අවශ්‍ය වේ. ජාත්‍යන්තර පොල් උපස්ථර නිෂ්පාදන ගැනුම්කරුවන් සෞඛ්‍යාරක්ෂිතව සැකසූ කොහුබත් මත පදනම් වූ නිෂ්පාදන ඉල්ලා සිටී. එබැවින් පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනකයින්ගේ සංගමයේ ඉල්ලීමක් මත අපනයන සංවර්ධන මණ්ඩලයේ, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ උපදේශක කමිටුව විසින් කොහුබත් වියළීම සඳහා වියළන යන්ත්‍රයක් නිපදවීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මධ්‍ය පරිමාණ කොහුබත් වියළීම සඳහා වියළන යන්ත්‍රයක් සංවර්ධනය කිරීම, කර්මාන්තය නඟා සිටුවීම සඳහා මූලික අවශ්‍යතාවයක් බව කමිටුව හඳුනාගෙන ඇත. එබැවින් ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය (NERDC), පොල් පර්යේෂණ ආයතනය (CRI) සහ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වියළුම් යන්ත්‍රය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව දිනකට කිලෝග්‍රෑම් 1000 ක ධාරිතාවකින් සහ කොහුබත්වල තෙතමනය 60% සිට 20% දක්වා අඩු කිරීමේ අරමුණින් වියළුම් යන්ත්‍රයක් නිර්මාණය කෙරේ. යෝජිත වියළුම යනු ඩීසල් සහ විදුලි බලයෙන් ස සමගාමී ද්‍රව්‍ය ප්‍රවාහයෙන් බල ගැන්වෙන භ්‍රමණ වියළනයකි. සැලසුම් කර ඇති වියළුමෙහි දිග මීටර් 10 ක් වන අතර සිලින්ඩර විෂ්කම්භය මීටර් 1 කි. වියළුමේ ඇස්තමේන්තුගත පර්යේෂණ හා සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 6.75 ක් සහ මිලියන 3.5 ක් CRI විසින් දරනු ලබන අතර ඉතිරි මුදල රුපියල් මිලියන 3.25 ක් NERDC විසින් දරනු ලැබේ. 2020 දී සවිස්තරාත්මක සැලසුම නිම කර, වියළනය නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලද අතර එය 2021 දී අවසන් වේ.



රූපය 1: සංවර්ධන අදියරේ කොහු නිස්සාරණ යන්ත්‍රය



සමාජ ආර්ථික පර්යේෂණ

පොල් මද, කෙඳි සහ අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශ වල සමස්ථ ක්‍රියාකාරීත්වය

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

පොල් කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය, වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය, පොල් සැකසුම් කර්මාන්ත සඳහා භාවිතා වන ගෙඩි ප්‍රමාණය, පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සහ දේශීය පරිභෝජනය සඳහා භාවිතා වන ගෙඩි ප්‍රමාණය මත ප්‍රධාන වශයෙන් රඳා පවතී. 2020 වසරේ ඇස්තමේන්තුගත ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2,818.3ක් වන අතර, එය 2019 වසරේ නිෂ්පාදනයට වඩා 9.3%ක් පමණ අඩු අගයක් වේ (ගෙඩි මිලියන 3,106.4). 2020 වර්ෂයේ පළමු මුර 5 දී ලැබුණු ගෙඩි අස්වැන්න 2019 වර්ෂයට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් වූ අතර, පළමු මුර 3 තුළ එම අඩු වීම කැපී පෙනුණි. විවෘත වූ හෝ විවෘත වී මාස 3ක් ඇතුළත පුෂ්ප මංජරිය $33^{0}C$ ක උෂ්ණත්වය ඉක්මවා යන උෂ්ණත්වයකට නිරාවරණය වීම මඟින් සැළකිය යුතු තරම් බැටිටි ප්‍රමාණයක් හැලී යාම සිදු වේ. එපමණක් නොව 2020 වර්ෂයේ මුල් භාගයේදී සෑම පොල් වගාකිරීමේ දිස්ත්‍රික්කයකම වර්ෂාපතනය 20%ක පමණ අඩුවීමක් පෙන්නුම් කර ඇත. එයද රටෙහි පොල් අස්වැන්න අඩු වීමට දායක වී ඇත.

පොල් සැකසුම් කර්මාන්තය සළකා බැලීමේදී පොල්තෙල් නිෂ්පාදනය වසර පුරාම අඩුවීමක් පෙන්නුම් කළ අතර, 2019 වර්ෂයට සාපේක්ෂව පොල්තෙල් අපනයනය 28%ක පමණ වර්ධනයක් පෙන්නුම් කර ඇත. වසරේ පළමු භාගය තුළ නැවුම් පොල්තෙල් නිෂ්පාදන කර්මාන්තය 18%ක වර්ධනයක් පෙන්වා ඇති නමුත් දිසිදි පොල් නිෂ්පාදනය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව 43%කින් අඩු වී ඇත. එමෙන්ම, දිසිදි පොල් මිල එම කාලසීමාව තුළ ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. සංඛ්‍යාලේඛන වලට අනුව 2020 වසරේ මුල් භාගයේ පොල් තෙල් මිල 28% සිට 77% දක්වා ඉහළ ගොස් ඇත. මෙම මිල වැඩි වීමට ප්‍රධාන වශයෙන් වසර තුළ ගෙඩි නිෂ්පාදනය අඩු වීම, කර්මාන්තය සඳහා ගෙඩි ඉල්ලුම වැඩි වීම සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු නිසි ලෙස කළමනාකරණය නොකිරීමෙන් දේශීය වෙළඳපොළේ ආහාරයට ගත හැකි තෙල් මිල වැඩි වීම යන සාධක හේතු විය. පොල් කිරි, පිටිකළ පොල් කිරි, දිසිදි පොල්, පොල් තෙල් සහ නැවුම් පොල් තෙල් වැනි සැකසුම් කර්මාන්ත සහ ගෘහස්ථ අමුපොල් පාරිභෝගිකයින් යන ප්‍රධාන කණ්ඩායම් දෙක අතර තරඟය විශේෂයෙන්ම පොල් ගෙඩි වල ගොවිපොළ මිල ඉහළ යාමට හේතු විය.

වසරේ මුල් භාගය තුළ බාද්‍ය තෙල් ආනයනය අඩු වූ නමුත්, වසරේ දෙවන භාගයේ බාද්‍ය තෙල් ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය ආනයන ප්‍රමාණයෙන් 20%ක වර්ධනය වීම නිසා පෙර වසරට සාපේක්ෂව විදේශ විනිමය පිරිවැය ද 79%කින් වැඩි විය. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ යාම සහ 2020 අප්‍රේල් සහ මැයි මාස වලදී සමහර කාණ්ඩ වල බාද්‍ය තෙල් ආනයනය අත්හිටුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

පාම් තෙල් පරිභෝජනය අධෛර්යමත් කිරීම සහ දේශීය පොල් තෙල් සහ අනෙකුත් ආහාරයට ගත හැකි තෙල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම රජයේ ප්‍රධාන අරමුණ වූ නමුත්, මෙම ප්‍රතිපත්තිය කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපාන ලදී. එසේම කොප්පරා අපනයනය ද වසර පුරාම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

පොල් මිල පුරෝකථනය සඳහා මිල ආකෘතියක් නිර්මාණය කිරීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය සහ ශාක කායික විද්‍යා අංශය

පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ගෝලීය සැපයුම සහ ඉල්ලුම පසුගිය දශක කිහිපය තුළ දැවැන්ත ලෙස ඉහළ ගොස් ඇත. එබැවින් පොල් කර්මාන්තය, නිෂ්පාදන රටවල ආර්ථිකයට වැදගත් දායකයෙක් බවට පත්ව ඇත. කෙසේ වෙතත්, අනෙකුත් කෘෂිකාර්මික භාණ්ඩ හා සමානව පොල් වල මිල ද නිතර වෙනස් වීමට ලක් වේ. එසේ හෙයින් පොල් ආශ්‍රිත නිෂ්පාදන දාමයේ සිටින අයගේ තීරණ ගැනීම පහසු කිරීම සඳහා මිල පුරෝකථනය කිරීමේ ආකෘතියක් නිර්මාණය කිරීම වැදගත්ය. එබැවින්, ආකෘති නිර්මාණයේදී භාවිතා කරන ප්‍රධාන ක්‍රම හා එක් එක් ක්‍රම වල ඉහළ ගුණාංග හා අඩුලුහුඩුකම් ඇගයීමත් සමඟ පොල් මිල පුරෝකථනය කිරීම සහ එම කාර්ය සඳහා විශ්වාසනීය ආකෘතියක් සකස් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. පෙර සිදු කර ඇති අධ්‍යයනයන් පිළිබඳ පුළුල් විග්‍රහයකින් පසුව පොල් මිල පුරෝකථනය සඳහා භාවිතා කරන ආකෘති හඳුනා ගැනීම සිදු විය.

පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන ශ්‍රී ලංකාවේ පොල් වගා කලාප තුළින් ලබා ගත් 2009 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වන අමු පොල් වල මාසික ගොවිපොළ මිල දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදී. පොල් වගාවෙහි යෙදෙන ප්‍රධාන ප්‍රදේශ තුනට වෙන වෙනම මාසික ගොවිපොළ මිල අනුව කාලශ්‍රේණි ආකෘති දෙකක් යොදා හොඳම ආකෘතිය හඳුනා ගන්නා ලදී. එක් විචල්‍යයක් සහිත කිසිම ආකෘතියක් කුරුණෑගල දත්ත සමඟ නොගැලපුණි. ආකෘති ඇගයීම සඳහා වෙනත් ආකෘතියක් යොදා පොල් නිෂ්පාදනය බාහිර සාධකයක් ලෙස සලකා ගොවිපොළ මිල ගණනය කිරීම සිදු කරන ලද අතර, එම ආකෘතිය මඟින් පොල් මිල පුරෝකථනය සිදු කළ හැකි බවට මූලිකව හඳුනා ගන්නා ලදී.

වගුව 1 :
පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය ප්‍රදේශ තුනෙහි ගොවිපොළ මිල

ආකෘතිය	පුත්තලම	ගම්පහ	කුරුණෑගල
ARIMA	0.1954 (1,1,5)	0.1842 (2,1,2)	NA
NARX	0.0540	0.1623	0.1591

ශ්‍රී ලාංකික පාරිභෝගිකයින්ගේ ගෘහස්ථ පොල් සහ ආහාරයට ගත හැකි තෙල් පරිභෝජනයේ රටා හඳුනා ගැනීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආහාර පරිභෝජන රටාව ක්‍රමයෙන් වෙනස් වීමකට ලක්ව ඇත. වෙළඳපොළ විවෘත වීම තුළ විවිධ ආදේශකවලට ඉඩ සැලසුන හෙයින් ආහාරයට ගත හැකි තෙල් සඳහා ද විවිධ ආදේශක වෙළඳපොළට ඇතුළත් විය. මෙය තවදුරටත් ආර්ථික හා සමාජීය සහ පාරිභෝගිකයින්ගේ රුචි අරුචිකම් සහ කර්මාන්ත මත තීරණය වන ජීවන රටාවේ වෙනස්කම් ද නිසා වෙනස් වන බව පෙනී ගොස් ඇත. එබැවින් මෙම අධ්‍යයනය බාද්‍ය තෙල් සහ ශ්‍රී ලංකාවේ පොල් පරිභෝජනයේ වෙනස්වීම ඇස්තමේන්තු කිරීමට මෙන්ම ග්‍රාමීය, නාගරික සහ වතු අංශ වල බාද්‍ය තෙල් සහ පොල් වල ගෘහස්ථ පරිභෝජනයේ වත්මන් රටාව හඳුනා ගැනීම අරමුණු කරයි.

ප්‍රකාශන වල අඩංගු ද්විතීයික දත්තවල මූලික විශ්ලේෂණ වලින් පෙනී යන්නේ ලාංකිකයන්ගේ බාද්‍ය තෙල් පරිභෝජන රටාවෙහි වෙනසක් සිදු වී ඇති බවයි. ඒ අනුව, දිගු කලක් තිස්සේ මේදය සපයන ප්‍රධාන ප්‍රභවය වූ පොල් තෙල් ප්‍රතිශතයක් ලෙස 94% (2006) සිට 88% (2016) දක්වා පහළ බැස ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන පෙන්නුම් කරයි. තවද, ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණය මත පදනම්ව ඇස්තමේන්තු කර ඇති ජාතික සමස්ථ දත්තයන්හි විශ්ලේෂණ පෙන්වා දී ඇත්තේ වැඩිම ආහාරයට ගත හැකි තෙල් වල නැඹුරුව ඇත්තේ අනෙකුත් ආහාරයට ගත හැකි තෙල් කාණ්ඩය තුළ බව සහ එළවළු තෙල් කාණ්ඩයට පොල්තෙල් සඳහා වැය කළ මුදල යොමු වීම බවය.

ඇසේරියා මයිටා පාලනය කිරීම සඳහා විලෝපික මයිටා මුදා හැරීමෙන් ඇති වන බලපෑම ඇස්තමේන්තු කිරීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ගොවිපොළ පාදක තත්ත්වයන් යටතේ මයිටාවන් පාලනය කිරීම සඳහා විලෝපික මයිටාවන් මුදාහැරීමේ සඵලතාවය ඇස්තමේන්තු කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරේ. දැනටමත් සිය රසායනාගාර තුළ විලෝපික මයිටාවන් අභිජනනය කිරීමේ නිරතව සිටින කුරුණෑගල වැවිලි සමාගමේ සහයෝගීතාවයෙන් මෙම පර්යේෂණය ආරම්භ කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර ඇති පරිදි විලෝපික මයිටාවන් මුදා හැරීම වසර දෙකක් අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර, 2019 සහ 2020 වර්ෂයන්හි පොල් නිෂ්පාදන දත්ත සංසන්දනය කරනු ලැබීය. පිළිවෙලින් 2019 සහ 2020 වසරේ මයිටා හානියට පත් සාමාන්‍ය ගෙඩි සංඛ්‍යාව මසකට 4.76ක් සහ 3.62ක් විය. මෙය සැලකිය යුතු අඩුවීමකි.

සම්පූර්ණ මිලට විකිණිය හැකි මයිටා හානියට පත් සාමාන්‍ය ගෙඩි සංඛ්‍යාව මසකට එක් ගසකින් ගෙඩි 3.5 සිට 2.5 දක්වා අඩු වී ඇති අතර, එය සැලකිය යුතු පහළ බැසීමකි. කෙසේ වෙතත් අර්ධ මිලට විකිණිය හැකි මයිටා හානියට පත් ගෙඩි සංඛ්‍යාව සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් නොකළේය. මෙම පර්යේෂණය විලෝපික මයිටාවන් මුදා හැරීමෙන් පසු ඇති වන බලපෑම් පරීක්ෂා කිරීම සඳහා තවත් වසරක් දීර්ඝ කරන ලදී.

ජාත්‍යන්තර කාබනික පොහොර ප්‍රමිතීන් ඇගයීම සහ ශ්‍රී ලංකාවේ කාබනික පොල් කර්මාන්තය සඳහා දේශීය කාබනික පොහොර ප්‍රභවයන් භාවිතයට අදාළ අපනයන රෙගුලාසි

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ නම් කාබනික පොහොර වල ජාත්‍යන්තර සහ ජාතික ප්‍රමිතීන් සහ කාබනික පොල් නිෂ්පාදන වෙළඳාමට ඇති බාධක හඳුනා ගැනීමයි. කාබනික පොහොර වර්ග රාශියක් ඇති නමුත්, මෙම අධ්‍යයනයේ ප්‍රධාන අවධානය යොමු වන්නේ කොම්පොස්ට් පොහොර සඳහා වේ. කොම්පෝස්ට් පොහොර වර්ග දෙකක් සඳහා එනම්, (අ) කෘෂිකාර්මික සම්භවයක් ඇති අමුද්‍රව්‍ය වලින් සාදන ලද කොම්පෝස්ට් සහ (ආ) නාගරික සහ සන අපද්‍රව්‍ය යොදා සාදන ලද කොම්පෝස්ට් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිතීන් නිකුත් කරනු ඇත. මෙම ප්‍රමිතීන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රධාන අපනයන රටවල් වල ප්‍රමිතිය සමඟ සංසන්දනය කරන ලදී. තවදුරටත් අදාළ අපනයන රෙගුලාසි අධ්‍යයනය කරන ලදී. ඊට අමතරව පොල් ත්‍රිකෝණය තුළ සිටින වාණිජ කොම්-පෝස්ට් නිෂ්පාදකයින් පිළිබඳ සමීක්ෂණයක්ද සම්පූර්ණ කර ඇත. එම සමීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුව, සමහර පරාමිතීන් එනම්, සම්පූර්ණ නයිට්‍රජන් අන්තර්ගත ප්‍රමාණය, සම්පූර්ණ පොස්පරස් අන්තර්ගතය, කාබන් : නයිට්‍රජන් අනුපාතය සහ වැලි ප්‍රතිශතය සම්මත අගයන් තුළ වන අතර, පී.එච්. අගය, විද්‍යුත් සන්නායකතාවය, කාබනික කාබන් සහ සම්පූර්ණ පොටෑසියම් අන්තර්ගතය සම්මත මට්ටමට වඩා අඩු බව අනාවරණය වූ අතර, තෙතමන ප්‍රතිශතය සම්මත මට්ටමට වඩා වැඩි විය.

අතිශත අවදානමට ලක් විය හැකි ප්‍රදේශ වල දේශගුණික අවිනිශ්චිතතාවය යටතේ පොල් ආශ්‍රිත ගෙවතු ඵලදායීතාව වැඩිදියුණු කිරීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

මෙම අධ්‍යයනය කොටස් තුනකින් සමන්විත වේ. අධ්‍යයනයේ පළමු කොටසේ අරමුණු (අ) වර්ෂාපතනයේ සහ වායු උෂ්ණත්වයේ දිගු කාලීන දේශගුණික ප්‍රවණතා පරීක්ෂා කිරීම (ආ) සාම්ප්‍රදායික නොවන පොල් වගා කරන දිස්ත්‍රික්ක හතරක ආන්තික දේශගුණික සිදුවීම්වල ප්‍රවණතා ඇස්තමේන්තු කිරීම. එනම්, රත්නපුර, යාපනය, හම්බන්තොට සහ මාතලේ ප්‍රදේශ වල පොල් වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමේ ශක්‍යතාවය සොයා බැලීමයි. මෙය සිදු කරනු ලබන්නේ පොල් පර්යේෂණ ආයතනයේ ශාක කායික විද්‍යා අංශය වෙතින් ලබා ගත් ද්විතීයික කාළගුණ විද්‍යාත්මක දත්ත භාවිතා කරමිනි. මේ සඳහා 1961 - 2015 කාලය තුළ කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් දත්ත උපයෝගී කර ගන්නා ලදී.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ දෛනික වර්ෂාපතනයේ සැලකිය යුතු ප්‍රවණතාවයක් නොපවතින බව ප්‍රතිඵලවලින් අනාවරණය වූ නමුත්, 1961-2015 කාලය තුළ උපරිම උෂ්ණත්වයේ සැලකිය යුතු අඩුවීමක් සහ අවම උෂ්ණත්වයේ වැඩිවීමක් අනාවරණය විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෛනික වර්ෂාපතනය සැලකිය යුතු ලෙස අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්වන අතර, දෛනික උපරිම සහ සහ අවම උෂ්ණත්ව ඉහළ යාමේ නැඹුරුතාවයක් පවතී. යාපනය තුළ උපරිම උෂ්ණත්වය ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, වර්ෂාපතනය සහ අවම උෂ්ණත්වය කිසිදු ප්‍රවණතාවයක් පෙන්නුම් නොකළේය. මාතලේ දිස්ත්‍රික්කයේ දෛනික වර්ෂාපතනයේ සහ උපරිම උෂ්ණත්වයේ ප්‍රවණතා පෙන්නුම් නොකරන ලදී. පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය කරමින් පවතී.

ශ්‍රී ලංකාවේ පොල් නැවත සිටුවීමේ වැඩසටහනේ සාර්ථකත්වය ඇගයීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

තිරසාර පොල් කර්මාන්තයක් ඇති කිරීමේ අරමුණින් පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව පොල් නැවත වගාකිරීමේ ජාතික වැඩසටහනට සහාය වීමට වාර්ෂිකව බීජ පැළ නිෂ්පාදනය කරයි. කෙසේ වෙතත්, පොල් කර්මාන්තය සඳහා මෙම බීජ පැළ ක්ෂේත්‍ර මට්ටමින් කෙතරම් සාර්ථකභාවයක් පෙන්නුම් කරන්නේද යන්න හඳුනා ගැනීමට නැවත වගා කිරීමේ වැඩසටහනේ ඇගයීමක් කර නොමැත. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ 2014 සිට ශ්‍රී ලංකාවේ බෙදා හරින ලද බීජ පැළවල වත්මන් තත්ත්වය ඇගයීම සහ එමඟින් නැවත වගාකිරීමේ ජාතික වැඩසටහනේ ඇති හිඩැස් තේරුම් ගැනීමය. තවද, අධ්‍යයනය තුළින් එම වැඩසටහනෙහි සඵලතාවය, ක්ෂේත්‍ර මට්ටමේ බීජ පැළ මිය යාමේ අනුපාතිකය, බීජ පැළ මිය යෑම සඳහා මූලික හේතු සහ තාක්ෂණය ගොවීන් වෙත රැගෙන යාමට ඇති අඩුපාඩු හඳුනා ගැනීම වේ.

2015 - 2017 කාලය තුළ නිකුත් කරන ලද කප්රුවන, කප්සුවය සහ කප්සෙත යන දෙමුහුන් කළ පොල් වර්ග තුනක් පුත්තලම, ගම්පහ, කුලියාපිටිය සහ කුරුණෑගල පොල් වගාකිරීමේ මණ්ඩල (CCB) ප්‍රදේශ වල සිදු කළ සමීක්ෂණයේ දී නිසි ලෙස කළමනාකරණය කරන ලද ගොවීන්ගේ ක්ෂේත්‍රවල මෙම දෙමුහුන් තුනේ සාර්ථකත්ව අනුපාතය 90%ක් බව සොයා ගන්නා ලදී. කළු කුරුමිණි හා ඉත්තෑ හානිය නිසා වාර්තා වූ වැඩිම හානිය 30 - 50%ක් විය. මෙම සමීක්ෂණයේ රැස් කරන ලද සියලුම දත්ත සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරමින් පවතී.

වගුව 1 : නව වගාව (NP), නැවත වගාව (RP), යටි වගාව (UP) සහ පුනරුත්ථාපන වගාව (RH) 2014 - 2017 දක්වා සහනාධාර ක්‍රම යටතේ ලබා දුන් පැළ ප්‍රමාණයන් සහ ප්‍රතිශතයන්

පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල	වර්ෂය	නිකුත් කළ මුළු පැළ ප්‍රමාණය	පැළ නිකුත් කළ සහනාධාර යෝජනා ක්‍රමය (නව/නැවත/ යටි/පුනරුත්ථාපන)	නිකුත් කළ පැළ ප්‍රමාණයෙහි ප්‍රතිශතය
ගම්පහ	2014	423,086	149,163	35.26%
	2015	196,447	136,250	69.36%
	2016	151,460	93,776	61.91%
	2017	199,823	128,823	64.47%
කුරුණෑගල	2014	615,991	279,632	45.40%
	2015	301,911	194,289	64.35%
	2016	325,163	202,772	62.36%
	2017	467,088	281,199	60.20%
කුලියාපිටිය	2014	427,992	225,656	52.72%
	2015	395,412	211,159	53.40%
	2016	196,823	151,570	77.01%
	2017	359,350	225,313	62.70%



පර්යේෂණ සංවර්ධනයන්

ගොවිපොළ පද්ධති ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

01. ජීව බලශක්ති නිෂ්පාදන ආදර්ශන

මෙම ආදර්ශනය රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පොල් ගස් 150ක් සහ ග්ලිරිසීඩියා ශාක 2500කින් සමන්විත හෙක්ටයාර් 01ක පොල් වගා භූමි ප්‍රමාණයක නිර්මාණය කර ඇත. මෙම ආදර්ශනයෙහි සිටින මී ගවයින් 06 දෙනා සඳහා අවශ්‍ය තණකොළ හා ග්ලිරිසීඩියා දර බලශක්තිය නිපදවීම සඳහා ද, ගව ඒකකයේ ගොම ජීව වායු ජනනය සඳහා ද, යොදා ගන්නා ලදී. මෙමඟින් ජනනය වන විදුලිය එක් පවුලක අවශ්‍යතාවය සපුරාලීමට භාවිතා කරයි. මෙම ආකෘතිය දැනට වගාකරුවන්ට ප්‍රායෝගිකව දැනුම ලබා දීම සඳහා භාවිතා කරයි.



රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ ග්ලිරිසීඩියා වගාව සහ ජෛව බලශක්ති නිෂ්පාදන ඒකකය

02. ඒකාබද්ධ සත්ත්ව පාලන ආදර්ශන

පොල් වගාව යටතේ ඒකාබද්ධ සත්ත්ව පාලනය,ගැටලු සහගත වල් පැළෑටි පාලනය කිරීමට සහ පොල් ඉඩම්වල සාරවත්බව වැඩි කිරීමට ඉතා ඵලදායී වන අතර වැඩිපුර සතුන් ගොවීන් වෙත විකිණීම ද සිදු කළ හැක. කුඩා වතු හිමියන්ගේ ලාභ ලැබීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් ඒකාබද්ධ සත්ත්ව පාලනය මඟින් පොල් වගාව යටතේ එළුවන් සහ බැටළුවන් ඇති කිරීමේ ආදර්ශන රත්මලාගාර වතු යායේ පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා සතුන් 50ක පමණ ප්‍රමාණයක් නිදැලි ක්‍රමයට සහ CO - 3 තෘණ කොටු තුළ ඇති කරනු ලබයි. මෙම ආකෘතිය ද වගාකරුවන්ට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා භාවිතා කරයි.



රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ එළු සහ බැටළු පාලන ආදර්ශන

03. තෘණ හා රනිල බෝග ආදර්ශන

රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානවල ආවරණ බෝග, තෘණ හා රනිල බෝග ක්ෂේත්‍ර ආදර්ශන දෙකක් පවත්වාගෙන යනු ලබයි. මෙම ආදර්ශ, පොල් ඉඩම්වල පශු සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රජාව, පොල් වගාකරුවන්, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික හා පාසල් සිසුන්ගේ දැනුම හා දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට දායක වේ. තවද 2019 වර්ෂය සඳහා එක් ගෝචර තෘණ විශේෂයක් සහ එක් ආවරණ බෝග විශේෂයක් අලුතින් හඳුන්වා දෙන ලදී.



රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානවල තෘණ, රනිල බෝග හා ආවරණ බෝග, ආදර්ශන

04. පණුවන් යොදා කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය

රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද පණුවන් යොදා කොම්පොස්ට් පොහොර නිෂ්පාදන ආකෘතිය ඉහළ ධාරිතාවයකින් ක්‍රියාත්මක වේ. ඒ සඳහා පොල් වගාවේ බහුලව ඉවත් වෙන අපද්‍රව්‍ය, වල් පැළෑටි සහ සත්ත්ව අපද්‍රව්‍ය භාවිතයෙන් කෙටි කාලයක් තුළදී පෝෂකවලින් පොහොසත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ වගාකරුවන් වෙත පණුවන් බෙදා දෙන අතර ගොවීන්, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික විද්‍යාල සහ පාසල් සිසුන්ට දැනුම ලබා දීම සඳහා ආකෘතියක් ලෙස ද, භාවිතා කරන ලදී.



රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පණු පොහොර නිෂ්පාදන ආදර්ශන

05. අතුරු බෝග ආදර්ශන

පොල් ඉඩම්වල අතුරු බෝග වගාව පිළිබඳ ව වගාකරුවන් හට දැනුම ප්‍රචලිත කිරීම සඳහා, අතුරු බෝග ආදර්ශන ඒකකයන් 20ක් මාකඳුර, රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව යන පර්යේෂණ මධ්‍යස්ථානයන්හි සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලැබේ. මෙම ආදර්ශන අපනයන බෝග, පලතුරු බෝග, දැව බෝග සහ තෘණවලින් සමන්විත වේ. වර්තමානයේ, දේශීය සහ විදේශීය වෙළඳපොළවල ඉහළ ඉල්ලුමක් පවතින බෝග දෙකක් වන කෝමාරීකා සහ දූරියන් ද අතුරු බෝග ලෙස මුලින් ගොවීන්ට හඳුන්වා දීම සිදු කර ඇත.



මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයේ අතුරු බෝග ආදර්ශන

තෙත් කලාපීය ගෙවතු සඳහා දෙමුහුම් පොල් පැළ බෙදාදීම (කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක)

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ වැඩි අස්වනු ලබාදෙන දෙමුහුම් වර්ග තෙත් කලාපීය ගෙවතු සඳහා ලබාදීම මගින් වාර්ෂික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමයි. ජාතික පොල් නැවත වගා කිරීමේ වැඩ සටහන සඳහා ගුණාත්මයෙන් යුත් බීජ පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතිය යටතේ පල්ලම බීජ පොල් උයනේ මව් ගස් 1000 ක් අත් පරාගනය කිරීම 2019 වර්ෂයේ සිදුකෙරිණි. මෙම ව්‍යාපෘතිය යටතේ පොල් පැළ නිෂ්පාදනය 2020 වසරේත් ක්‍රියාත්මක වූ අතර එසේ නිපද වූ පොල් පැළ තෙත් කලාපීය ගොවීන් අතර බෙදා දීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ සහයෝගීතාවයෙන් සිදුකරන ලදී. ඒ යටතේ දෙමුහුම් පොල් පැළ 14,982 ක් කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල ගෙවතු 7491 සඳහා ලබාදෙන ලදී.



කෑගල්ල බටුවත්ත ප්‍රදේශයේ දෙමුහුම් පොල් පැළ ගෙවතු සඳහා බෙදා දීම.

කිනියම බීජ පොල් උයන සංවර්ධනය කිරීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න ඉහළ නැංවීමේ හා පොල් ඉඩම් වල ඵලදායිතාව වැඩි කිරීමේ ඉදිරි ගමන් මාර්ගයක් ලෙස දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම යොදා ගත හැකිය. එම නිසා ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය හා හලාවත වැවිලි සමාගම එක්ව 2013 වර්ෂයේ දී කිනියම බීජ පොල් උයන ස්ථාපනය කරන ලදී. එහි අරමුණ වුයේ ඉහළ අස්වැන්නක් සහිත කප්රුවන දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනයයි.

2020 වසරේදී මෙම බීජ පොල් උයන වටා මීටර් 2000 දිග වැටක් ඉදිකරන ලදී. වත්ත තුළ පැවති ගොඩනැගිල්ලක් පරාග සැකසුම් විද්‍යාගාරයක් ලෙස නවීකරණය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. බීජ පොල් උයනේ ඇති පුරප්පාඩු පිරවීම සඳහා කොළ කුන්දිරා පැළ 810ක් සිටුවීම සිදු කෙරිණි. පුරප්පාඩු පිරවීමේ අරමුණ සහිතවම කොළ කුන්දිරා බීජ 1000 ක් තවාන් ගත කිරීම සිදු කරන ලදී. තව ද සැන්රාමන් වර්ගයේ ඇති පුරප්පාඩු පිරවීම සඳහා පැළ ලබා ගැනීමට පල්ලම බීජ පොල් උයනේ සිදුකළ අත් පරාගන වැඩසටහන අවසන් කරන ලදී. මෙම වැඩසටහනින් නිපදවූ පැළ 2021 මහ කන්නයේදී පුරප්පාඩු සිටුවීම සඳහා යොදා ගැනීමට නියමිතය.



තාක්ෂණ හුවමාරු කටයුතු

පොල් වගාව සහ අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

තාක්ෂණ හුවමාරු අංශය

ඉහත අධ්‍යාපනික වැඩසටහන පොල් වගාකරුවන් අතර ඉතා ජනප්‍රියය. නමුත් කොවිඩ් වසංගතය නිසා රටෙහි ඇතිවූ අවාසනාවන්ත තත්ත්වය හේතුවෙන් 2020 වසර තුළ මෙම වැඩසටහන නොපැවැත්විණි.

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන්

තාක්ෂණ හුවමාරු අංශය

වසර 2020 තුළ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 25ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. නමුත් රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා ගොවි කණ්ඩායම්වලින් ඉල්ලීම් නොතිබුණි. එම නිසා 2020 වසර තුළ මෙම වැඩසටහන නොපැවැත්විණි.

පර්යේෂණ ව්‍යාප්ති සංවාද

තාක්ෂණ හුවමාරු අංශය

ක්ෂේත්‍රයේ වත්මන් ගැටලු සාකච්ඡා කිරීම සඳහා දෙසැම්බර් 09 වන දින කුරුණෑගල, කුලියාපිටිය සහ මාරවිල පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශිකයන්ට අයත් ක්ෂේත්‍ර හා ව්‍යාප්ති නිලධාරීන් සඳහා සූම් තාක්ෂණය ඔස්සේ එක් පර්යේෂණ ව්‍යාප්ති සංවාදයක් පමණක් පවත්වන ලදී. තවද පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට ක්ෂේත්‍රයේ පවතින ගැටලු විසඳීම සඳහා අවශ්‍ය නව නිර්දේශ හඳුන්වා දීමට ද එය අවස්ථාවක් ලබා දුණි. ඒ හැර එය පොල් පර්යේෂණ ආයතනයට නව පර්යේෂණ ගැටලු හඳුනාගැනීමට උපකාරී විය.



සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන පර්යේෂණ ව්‍යාප්ති සංවාද

අගය එක් කළ පොල් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන

තාක්ෂණ හුවමාරු අංශය

විදාතා මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධව ග්‍රාමීය ව්‍යවසායකයන් සඳහා පැවැත්වීමට වැඩසටහන් 08ක් සැලසුම් කර තිබුණ ද, රටෙහි පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඒවා නොපවත්වන ලදී.

ඉරුදින පුවත්පත් සමඟ පත්‍රිකා බෙදා හැරීම.

තාක්ෂණ හුවමාරු අංශය

පොල් වගා තාක්ෂණික දැනුම වගාකරුවන් වෙත බෙදා හැරීම සඳහා ඉරුදින පුවත්පත් සමඟ පත්‍රිකා බෙදා හැරීමේ වැඩසටහනක් 2019 වසරේදී නියමු ව්‍යාපෘතියක් ලෙස තාක්ෂණ හුවමාරු අංශය විසින් අරඹන ලදී. 2020 වසර තුළදී විවිධ පණිවිඩ සහිත පත්‍රිකා 45,500ක් මීරිගම, නෙළුම්දෙණිය, දඹදෙනිය, මාකඳුර, මීගමුව, දංකොටුව, සීදුව, කොච්චිකඩේ, නාත්තන්ඩිය, මාරවිල, කාක්කපල්ලිය, නිකවැරටිය, පල්ලම, කුලියාපිටිය, හෙට්ටිපොළ, බංගදෙණිය, ආඩිගම, පස්යාල, වරකාපොළ, ගිරිඋල්ල, ගනේමුල්ල, ගම්පහ සහ ගෝනවිල ප්‍රදේශවල බෙදාහරින ලදී.

පාසැල් අධ්‍යාපනික වැඩසටහන්

තාක්ෂණ හුවමාරු අංශය

රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා පාසැල් අධ්‍යාපනික වැඩසටහන් නොපවත්වන ලදී.

විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා සිදු කරන අධ්‍යාපන වැඩසටහන්

තාක්ෂණ හුවමාරු අංශය

විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රයෝගික පුහුණු වැඩසටහන් 04ක් පවත්වන ලදී.

විශ්ව විද්‍යාල	කෘෂිකර්ම විද්‍යාල / ආයතන
ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය	ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, ලබුදූව
විවෘත විශ්ව විද්‍යාලය	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

ප්‍රදර්ශන හා බෝග සායන

තාක්ෂණ හුවමාරු අංශය

රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රදර්ශන හෝ බෝග සායන කිසිවක් සඳහා සහභාගි වීමට පොල් පර්යේෂණ ආයතනයට ආරාධනා නොලැබුණි.

ජන මාධ්‍ය හරහා තාක්ෂණය බෙදා හැරීම.

තාක්ෂණ හුවමාරු අංශය

පුවත්පත් ලිපි

වසර 2020 තුළ එක් පුවත්පත් ලිපියක් පමණක් දිවයින පුවත්පතේ පළ කරන ලදී. එය ''විද්‍යාත්මකව පොහොර භාවිතයෙන් පොල් අස්වැන්න වැඩි කිරීම'' පැහැදිලි කරමින් ලියැවිණි.

මුද්‍රණ හා ප්‍රකාශන

තාක්ෂණ හුවමාරු අංශය

වසර පුරා තාක්ෂණ හුවමාරු අංශය මගින් පහත මුද්‍රණ ප්‍රකාශනයට පත් කරන ලදී.

1. උපදේශ පත්‍රිකා ඒ කාණ්ඩය (සිංහල)
2. උපදේශ පත්‍රිකා බී කාණ්ඩය (සිංහල)
3. උපදේශ පත්‍රිකා ඒ කාණ්ඩය (දමිළ)
4. පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2018
5. රතු කුරුමිණි ජෙලි පෙරමෝනය පිළිබඳ පත්‍රිකාව
6. රතු කුරුමිණි පරීක්ෂකය පිළිබඳ පත්‍රිකාව

මෙම වසර තුළ අංශයේ ප්‍රකාශන ඒකකය මුද්‍රණ කටයුතු රාශියක් සිදු කරමින් මුද්‍රණ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගන්නා ලදී. මෙම ඒකකය වෙනත් අංශවල මුද්‍රණ කටයුතු හා බැඳීමේ කටයුතු 52ක් සිදු කරන ලද අතර ඒ සඳහා වියදම රු. 567,141.00ක් විය. මේ යටතට පොත් පිංච, පත්‍රිකා, කාර්යාලීය පෝරම, චක්‍රලේඛන, විවිධ වර්ගයේ පෝරම, දත්ත පත්‍ර, ලිපි, සමීක්ෂණ ප්‍රශ්නාවලි, සහතික, ලිපිගොනු කවර, අත්පත්‍රිකා අයත් වේ.

පොල් තාක්ෂණ උද්‍යානය

තාක්ෂණ හුවමාරු අංශය

තාක්ෂණ හුවමාරු අංශය මගින් නඩත්තු කෙරෙන බණ්ඩිරිප්පුව වත්තේ පිහිටි තාක්ෂණ උද්‍යානය පොල් වගාකරුවන්, පාසල් සිසුන් සහ පොදු ජනතාව අතර ඉතා ජනප්‍රිය වුවද පොල් තාක්ෂණ උද්‍යානය හා එහි පැවැත්වෙන බෝග සායන කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මහජනතාව සඳහා නොපවත්වන ලදී.

ප්‍රශස්ත ව්‍යාපාර පහසුකමේ දී පවත්වන ලද පුහුණු වීම්.

පොල් සැකසුම් පර්යේෂණ අංශය

තැඹිලි වතුර බෝතල් කිරීම, නාටා ඩි කොකෝ නිෂ්පාදනය, පොල් කිරි සැකසීම, වර්ජින් පොල්තෙල් නිෂ්පාදනය සහ පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදනය පිළිබඳ පුහුණු කිරීම් පහක් (05) ප්‍රශස්ත ව්‍යාපාර පහසුකමේදී පවත්වන ලදී.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සඳහා තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්.

වගා සංරක්ෂණ අංශය

1) වගා සංරක්ෂණ අංශයේ පර්යේෂණ නිලධාරී පී.එච්.පී.ආර්. ද සිල්වා මහතා විසින් විවිධ සම්මන්ත්‍රණවලදී පහත සඳහන් දේශන හා දැනුවත්කිරීම් සිදු කරන ලදී.

   a) වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සහ මාතර දිස්ත්‍රික්කයේ පොල් වගාවන් සඳහා ඉදිරී වසර 05 වෙනුවෙන් උපායමාර්ගික සැලසුම් " යන මැයෙන් 2020.01.07 දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමකදී දේශනයක් පවත්වන ලදී.

   b) දකුණු පළාතේ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයේ කළමනාකරණ වැඩසටහනේ වත්මන් තත්ත්වය" යන මැයෙන් 2020.01.24 දින පොල් පර්යේෂණ මණ්ඩලයේ සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන්, පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා දකුණු පළාත් පොල් වගාකරුවන්ගේ සංගමයේ නියෝජිතයන් මාතරදී සහභාගි වූ රැස්වීමේදී දේශනයක් පවත්වන ලදී.

   c) දකුණු පළාතේ පොල් වගාවන්ට පැතිරී යන වසංගත රෝගය සහ එය කළමනාකරණය" යන මැයෙන් 2020.03.13 දින පොල් පර්යේෂණ ආයතනයේ පැවති මණ්ඩලීය රැස්වීමේදී දේශනයක් පවත්වන ලදී.

   d) දකුණු පළාතේ පොල් වගාවන්ට පැතිරී යන වසංගත රෝගය සහ එය කළමනාකරණය" යන මැයෙන් 2020.07.06 දින ලබුදූව පොල් වගාකිරීමේ මණ්ඩලයේදී පොල් සංවර්ධන නිලධාරීන්ට දේශනයක් පවත්වන ලදී.

   e) දකුණු පළාතේ පොල් වගාවන්ට පැතිරී යන වසංගත රෝගය සහ එය කළමනාකරණය" යන මැයෙන් 2020.08.08 දින මාතර පොල් වගාකිරීමේ මණ්ඩලයේදී දකුණු පළාත් පොල් වගාකරුවන්ගේ සංගමයේ සාමාජිකයන් හට දේශනයක් පවත්වන ලදී.

f) දකුණු පළාතේ පොල් වගාවන්ට පැතිරී යන වසංගත රෝගය සහ එය කළමනාකරණය" යන මැයෙන් 2020.10.02 දින බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කෘෂිකර්මාන්ත කමිටු රැස්වීමේදී දේශනයක් පවත්වන ලදී.

2) වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයේ පොල් ගස් ඉවත් කිරීමේ වැඩසටහන සඳහා බඳවා ගත් නව ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන් පී.එච්.පී.ආර්. ද සිල්වා මහතා විසින් පවත්වන ලදී.



පාර්ශ්වකරුවන් වෙත ලබා දෙන
සේවා තුළින් ජාතික
සංවර්ධනයට ලබාදෙන දායකත්වය

වැඩි දියුණු කළ බීජ පොල් නිපදවීම හා බීජ පැළ සහතික කිරීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

2020 වර්ෂයේදී අඹකැලේ, මාදුරුඔය හා පල්ලම බීජ පොල් උයන් තුන මගින් CRIC60 බීජ පොල් බීජ 884,078 ක් හා CRIC 65 බීජ පොල් 74,863 ක් නිපදවීම සිදු කර ඇත. තවද අත්පරාගනය මගින් CRISL 98 වර්ගයෙන් බීජ 23,221 ක් කප්රුවන 6305ක් කප්සෙත 2241 ක් හා කප්සුවය 3963 ක් වන ලෙස දෙමුහුම් බීජ පොල් නිපදවා ඇත.

බීජ පොල් පැළ සහතික කිරීමේ වැඩසටහන් යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ ඒකකයේ නිළධාරීන් විසින් 2020 වර්ෂය තුළ CRIC60 බීජ පැළ 401,040 ක්, කසෘෂක65 පැළ 99,450 ක්, මොරෝක් උස 76,608ක්, CRISL98 පැළ 32,178ක්, කප්රුවන පැළ 6,990 ක් කප්සුවය පැළ 9,771 ක්, කප්සෙත පැළ 4045 ක් සහ උසස් පොල් පැළ 83,986 ක් ලෙස මුළු පොල් පැළ 714,068 ක් සහතික කිරීම සිදුකරන ලදී.



පොල් පර්යේෂණ ආයතනය මගින් සහතික කළ පොල් පැළ

දීකිරි පොල් පැළ නිකුත් කිරීම.

පටක රෝපණ අංශය

2020 වර්ෂය තුළදී පටක රෝපිත දීකිරි පොල් පැළ 200 පමණ දෘඩකරන ලද අතර, පැළ 20 පොල් වගාකරුවන් වෙත ලබාදෙන ලදී. මීට අමතරව, පැළ 60 පමණ මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයේ සිටුවීම සඳහා සුදානම් කර තිබුණි.

2020 වසරේ ජාතික පොල් එලදාව ඇස්තමේනතු කිරීම හා 2020 වසරේ ජාතික පොල් එලදා පුරෝකථනය

ශාක කායික විද්‍යා අංශය හා කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

2020 වසර සඳහා ඇස්තමේන්තු කළ පොල් එලදාව ගෙඩි මිලියන 2818.3 ක් විය. එය 2019 වසරේ පොල් එලදාව (ගෙඩි මිලියන 3106.4) හා සසඳන විට 9% ක පමණ අඩු වීමකි. 2020 වසර සඳහා පුරෝකථනය කළ පොල් එලදාව ගෙඩි මිලියන 2708.2± 25.6 ක් වූ අතර එය ගෙඩි මිලියන 2682.6 සිට ගෙඩි මිලියන 2733.8 දක්වා පරාසයක විචලනය විය. පොල් නිෂ්පාදනය සම්බන්ධ ඉහත තොරතුරුද දිස්ත්‍රික්ක අනුව කාලගුණික සාධක වල වෙනස්වීම්ද ඇතුළත්ව මුද්‍රිත අත් පත්‍රිකා කලාප දෙකක්, අදාළ නිලධාරීන්, පොල් වගාකරුවන් හා ව්‍යවසායකයන් අතර බෙදා හැර ඇත. මීට අමතරව විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත ද්විමාසිකව ජාතික පොල් නිෂ්පාදනය හා පුරෝකථනයට අදාළ යාවත්කාලීන තොරතුරු විද්‍යුත් තැපෑල මගින් ඔවුන් වෙත ලැබීමට සලස්වා ඇත.

a)



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
Forecast 2020	388.3	527.6	584.3	420.0	395.2	392.7
ANCP 2020	418.80	525.50	553.16	507.28	443.09	370.47

Time (Months / Picks)

b)



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
ANCP 2019	507.95	565.77	619.13	547.61	495.19	370.83
ANCP - 2020	418.80	525.50	553.16	507.28	443.09	370.47

Time (Months / Picks)

රූපය (a) 2020 වසර සඳහා පුරෝකථනය කළ ද්වීමාසික ඵලදාව හා අදාළ කාල වකවානු සඳහා ඇස්තමේන්තු ගත පොල් ඵලදාව අතර සන්සන්දනය සහ (b) එය 2019 වසරේ ජාතික පොල් නිෂ්පාදනය සමඟ සන්සන්දනය

කාලගුණ විද්‍යා දත්ත සැපයීම.

ශාක කායික විද්‍යා අංශය

බණ්ඩිරිප්පුව, රත්මලාගාර, අඹකැලේ, මාදුරුඔය සහ මිද්දෙණිය යන පර්යේෂණ මධ්‍යස්ථානවලින් දිනපතා වාර්තා කරන ලද වර්ෂාපතනය, වායු ගෝලීය හා පාංශු උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, සුළඟේ වේගය සහ සුර්ය පැය ගණන යන කාලගුණික පරාමිතීන් වල දෛනික වාර්තා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යන ජාතික දත්ත ගොනුවට සපයන ලදී. මෙම පරාමිතීන්ගේම මාසික වාර්තා, පොල් වගා කරුවන්, කර්මාන්තකරුවන්, විද්‍යාඥයන්, ශිෂ්‍යයන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල (වෙන්නප්පුව, මහවැව, මාදම්පේ, සහ දංකොටුව) වෙත ඔවුන්ගේ ඉල්ලීම මත සපයන ලදී.



ස්වයංක්‍රීයව කාලගුණ දත්ත වාර්තා කිරීමේ පහසුකම් සහිත බණ්ඩිරිප්පුව වත්තේ පිහිටා ඇති කෘෂි කාලගුණික මධ්‍යස්ථානය

අපනයන වෙළෙඳපොළ සඳහා තැඹිලි වල තත්ත්ව සහතික කාලය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය බෙදාහැරීම.

ශාක කායික විද්‍යා අංශය

පසුගිය වසර තුළ උක්ත ක්‍රමවේදය අපනයන-කරුවන් (14) දෙනෙකු අතරේ ව්‍යාප්ත කරන ලදී. පසුගිය වර්ෂ වල තැඹිලි අපනයන රටවල් 25ක් අභිබවා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර අපනයන පරිමාව ගෙඩි මිලියන 06 ඉක්මවා යන ලදී. කෙසේ නමුත් 2020 වසර තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා අපනයනය කරන ලද තැඹිලි ප්‍රමාණය මිලියන 5.294 දක්වා අඩු වී ඇත. මාර්තු සිට මැයි දක්වා අපනයනය කරන ලද තැඹිලි ප්‍රමාණයේ කැපී පෙනෙන අඩු වීමක් තිබූ අතර ජූනි මාසයෙන් පසු නැවත වැඩිවීමක් පෙන්නුම් කර ඇත.



පොල් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දුන් වැඩි දියුණු කළ ක්‍රමවේදයට අනුව 2020 වසරේ අපනයන කළ තැඹිලි ප්‍රමාණය

පාර්ශ්වකරුවන්ට සේවා සැපයීම හරහා ජාතික සංවර්ධනයට දායක වීම.

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් සැකසුම් පර්යේෂණ අංශය නියැදි විශ්ලේෂණය කරමින් (වර්ජින් පොල්තෙල් සාම්පල් 92, සුදු පොල්තෙල් සාම්පල් 54, වියළි පොල් සාම්පල් 8, පොල් පිටි 04 සහ පූනාක් සාම්පල 07) පාර්ශවකරුවන් වෙත සිය සේවාවන් ලබා දුන්නේය. කොප්පරා නිෂ්පාදනය, සුදු පොල්තෙල්, පොල් කිරි, පොල් වතුර, පොල් පිටි, පොල් අයිස්ක්‍රීම් සහ නාටා ඩි කොකෝ නිෂ්පාදනය යන තාක්ෂණික ක්‍රම පිළිබඳව පාර්ශවකරුවන් උනන්දු විය. විවිධ නිෂ්පාදන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ගනුදෙනු කරුවන් සඳහා ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම විවෘත විය. පැමිණි අය අතරින් සුදු පොල්තෙල් සහ කොප්පරා නිෂ්පාදනය සඳහා 14 ක්, වර්ජින් පොල්තෙල් සඳහා 12 ක්, පොල් වතුර බීම සඳහා 14 ක්, පොල් අයිස්ක්‍රීම් සඳහා 8 ක්, නාටා ඩි කොකෝ සඳහා 6ක් සහ තවත් අමුත්තන් 15 ක් විවිධ අරමුණු සඳහා පුහුණු කර හුරුපුරුදු කර ඇත.

"කප්රුක" කෙටි පණිවිඩ සේවය

තාක්ෂණ හුවමරු අංශය

නියමු ව්‍යාපෘතියක් ලෙස 2015 වසරේ ආරම්භ කරන ලද "කප්රුක" කෙටි පණිවිඩ සේවාව පොල් වගාකරුවන් අතර ක්‍රම ක්‍රමයෙන් එහි ජනප්‍රියත්වය පුළුල් කළේය. ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස දැන් පොල් වගාකරුවන්ට දෙසතියකට වරක් පොල් ගෙඩියක ගොවිපොළ මිල, දිසිදි පොල් මිල, කොප්පරා සහ පොල් තෙල් මිල පිළිබඳව පණිවිඩ ලබා ගත හැක. ඉදිරි මාසය සඳහා අස්වැන්න පුරෝකථනය ද මෙම සේවාව හරහා සන්නිවේදනය කරන ලදී. වසර තුළදී වගාකරුවන් වෙත පණිවිඩ 75895ක් යවා ඇති බව අපගේ වාර්තා අනාවරණය කරයි.

වගාකරුවන් වෙත උපදේශන සේවා ලබාදීම.

තාක්ෂණ හුවමාරු අංශය

වර්ෂය තුළ අංශය විසින් ක්ෂේත්‍ර පරීක්ෂා 08ක් සිදුකර අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තා ලබා දෙන ලදී. අනෙකුත් සාමාන්‍ය ඉල්ලීම් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ පොල් වගා කිරීමේ කාර්ය මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත යොමුකරන ලදී. පොල් වගාකරුවන්ගෙන් තාක්ෂණික උපදෙස් සහ තොරතුරු ඉල්ලා ලැබුණු දුරකථන ඇමතුම් සහ ලිපි සංඛ්‍යාව 820කට ආසන්න වූ අතර ඔවුන්ට අවශ්‍ය උපදේශන සහය අංශයේ කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන ලදී.

පොල් මයිටාවන් පාලනය සඳහා විලෝපික මයිටාවන් නිෂ්පාදනය

වගා සංරක්ෂණ අංශය

පොල් මයිටාවන් පාලනය සඳහා විලෝපික මයිටාවන් නිෂ්පාදනය නොනවත්වා සිදු කරගෙන යන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ විලෝපික මයිටා විද්‍යාගාරයේ, විලෝපික මයිටා පැකට් 12,751ක් නිෂ්පාදනය කල අතර පැකට් 7505ක් වගාකරුවන් හට විකුණන ලදී.

වගා සංරක්ෂණ අංශය විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන විලෝපික මයිටා විද්‍යාගාරය සඳහා තාක්ෂණික මගපෙන්වීම ලබා දෙයි. මෙම වසර තුළදී ඩෙසි වැලි වත්ත, ගම්පහ, කෑගල්ල, මඩකලපුව, අම්පාර, මුලතිව් හා පලෙයි වල විද්‍යාගාරවල තාක්ෂණික ගැටලු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ආරක්ෂිත කලාපයක් පවත්වාගෙන යාම

වගා සංරක්ෂණ අංශය

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය හේතුවෙන් පොල් ගස් ඉවත් කිරීමේ වැඩසටහන නොනවත්වා සිදු කරන ලදී. ආරක්ෂිත කලාපයේ පොල් ගස් සලකුණු කිරීම හා ඉවත් කිරීම පොල් පර්යේෂණ ආයතනය මඟින් සිදු කරන ලදී. අක්කර 13,294.48ක් ආවරණය වන පරිදි දකුණු පළාතේ ඉඩම් 10,507ක් ආරක්ෂිත කලාප කළමනාකරණ වැඩසටහන යටතේ පරීක්ෂා කෙරිණි. රෝගය ආසාදනය වූ පොල් ගස් 895ක් හඳුනා ගත් අතර 451ක් ඉවත් කෙරිණි.

පොල් දළඹුවා පාලනය කිරීම සඳහා පරපෝෂිතයන් අභිජනනය කිරීම.

වගා සංරක්ෂණ අංශය

වගා සංරක්ෂණ අංශය මඟින් පොල් දළඹු උවදුර පාලනය කිරීම සඳහා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථානයේ පරපෝෂිතයන් අභිජනනය කිරීම නොනවත්වා සිදු කරගෙන යන ලදී. පොල් දළඹුවන් ආසාදනය වූ වතුවලට පරපෝෂිතයන් 676,305 නිදහස් කරන ලදී.

රතු කුරුමිණියන් පාලනය සඳහා පෙරමෝන නිෂ්පාදනය හා විකිණීම.

වගා සංරක්ෂණ අංශය

වගා සංරක්ෂණ අංශයෙහි විද්‍යාගාරය රතු කුරුමිණි ආකර්ෂක පෙරමෝන නිෂ්පාදනය කළ අතර පෙරමෝන නළ 499ක් හා වැඩිදියුණු කරන ලද ජෙලිමය පෙරමෝන පැකට් 382ක් වගාකරුවන් හා පොල් වගාකිරීමේ මණ්ඩලයට විකුණන ලදී.

මොනොක්‍රොටපස් 60 SL ආනයනය කිරීම සම්බන්ධීකරණය

වගා සංරක්ෂණ අංශය

පොල් පර්යේෂණ ආයතනය විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයට රතු කුරුමිණි උවදුර පාලනය කිරීම සඳහා මොනොක්‍රොටපස් 60 SL ලීටර් 2000ක් ආනයනය කර බාරදෙන ලදී.

පොහොර නිර්දේශ සඳහා විශ්ලේෂණ වාර්තා ලබාදීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

විශ්ලේෂිත සේවාව	විශ්ලේෂණය කරන ලද නියදි ගණන
පස්	46
පත්‍රිකා	08
ජලය	12
පොල් කෙඳි නිෂ්පාදන	1065
කාබනික පොහොර	18
අකාබනික පොහොර	67

අනෙකුත් ආයතන සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු ලබා දීම.

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.

1. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඇතුළු වෙනත් ආයතන සහ අනෙකුත් පාර්ශවකරුවන් වෙත පොල් ආශ්‍රිත සංඛ්‍යාලේඛන හා දත්ත සැපයීම.
3. විවිධ අවශ්‍යතා සඳහා ඉවත් කරන පොල් ගස් සඳහා මිල ගණන් ඇස්තමේන්තු සැපයීම.
4. අයවැය වාර්තාව සැකසීමට හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පුස්තකාලයට පොල් හා සම්බන්ධ තොරතුරු හා සංඛ්‍යාලේඛන ලබා දීම.
5. පොල් ආශ්‍රිත සමාජ ආර්ථික දත්ත සැපයීමේ මධ්‍යස්ථානයේ මූලස්ථානය ලෙස කටයුතු කිරීම.
6. කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම.
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමේ ජාතික විද්‍යා හා තාක්ෂණ කාලීන වාර්තාව සඳහා දත්ත ලබා දීම.
8. ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධන දත්ත සමීක්ෂණය සඳහා දත්ත ලබා දීම.
9. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ INFORM දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා දීම.

පුස්තකාල සේවා

කොවිඩ් 19 වසංගතය නිසා පුස්තකාලය විවෘතව පැවතියේ සීමිත දින ගණනකි. එබැවින් ලැබුණු දත්ත ඉල්ලීම් සහ විමසීම් සඳහා, මාර්ගගත තාක්ෂණය ඔස්සේ සේවාවන් සපයන ලදී. මීට අමතරව, ඡායා පිටපත් සේවයද ලබාදෙනු ලැබිණි.

ඉංජිනේරුමය කාර්යයන්

පහත සඳහන් ප්‍රධාන අලුත්වැඩියා හා නඩත්තු කටයුතු 2020 වර්ෂය තුළදී ඉංජිනේරු ඒකකය විසින් ඉටු කරන ලදී.

මූලධන වියදම් යටතේ සිදුකළ අලුත්වැඩියාවන්

1. HO/GR.02/14 නිල නිවස අලුත්වැඩියා කිරීම
2. HO/GR.03/05 නිල නිවස අලුත්වැඩියා කිරීම
3. HO/GR.03/03 නිල නිවස අලුත්වැඩියා කිරීම
4. යෝජිත තට්ටු දෙකේ පොදු පර්යේෂණාගාරය ඉදි කිරීම. (අදියර - 1)

ඉහත කාර්යයන්ට අමතරව ගොඩනැගිලි වල වහල වල, විදුලි පද්ධති වල, වායු සමීකරණ හා දුරකථන වල එදිනෙදා නඩත්තු කටයුතු ඉටු කරන ලදී.



ජාතික සහයෝගිතා වැඩසටහන

අවබෝධතා ගිවිසුම්

පොල්සැකසුම් පර්යේෂණ අංශය

1. "ඇල්සයිමර් ඩිමෙන්ශියාවට ප්‍රතිකාර කිරීමේදී වර්ජින් පොල්තෙල් අහඹු ලෙස පාලනය කිරීමේ අත්හදා බැලීම" පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම 2019 සිට 2020 දක්වා දීර්ඝ කරන ලදී.
2. "මිනිසුන්ගේ දෙවන වර්ගයේ දියවැඩියාව සමනය කිරීම සඳහා වර්ජින් පොල්තෙල් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය" පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම 2019 සිට 2020 දක්වා දීර්ඝ කරන ලදී.
3. "මෘදු සංජානන දුර්වලතා සහ මෘදු සිට දරුණු ඇල්සයිමර් රෝගය ඇති පුද්ගලයින් සඳහා අතිරේක වර්ජින් පොල්තෙල් / පොල් නිෂ්පාදන භාවිතයේ කාර්යක්ෂමතාවය නිර්ණය කිරීම; ප්‍රජා මූලික සසම්භාවී, ද්විත්ව අන්ධ, ප්ලේසෙබෝ පාලනය, ප්‍රායෝගික" 2019 සිට 2020 දක්වා දීර්ඝ කරන ලදී.
4. වියළන යන්ත්‍රය සහ පොල් ලෙලි තන්තු නිස්සාරණය සඳහා පර්යේෂණ සිදු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය, ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, අපනයන සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, කොහු කෙඳි මෝල්කරුවන්ගේ සංගමය සහ පොල් ආශ්‍රිත උපස්ථර අපනයනකරුවන්ගේ සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 2020 දී කර්මාන්තය සඳහා යන්ත්‍ර.
5. "ශ්‍රී ලංකා දේශීය පොල් වගාවේ අර්ධ වශයෙන් අපද්‍රව්‍ය ඉවත් කරන ලද පොල්වල ප්‍රතිඔක්සිකාරක සහ දියවැඩියා විරෝධී ක්‍රියාකාරකම්" පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ ජාතික මූලික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුම අඛණ්ඩව සිදු කරන ලදී.



වතු කළමනාකරණ කටයුතු



වතු කළමනාකරණ අංශය

(ජාන සම්පත් මධ්‍යස්ථාන/පර්යේෂණ මධ්‍යස්ථානය)

පොල් පර්යේෂණ ආයතනයේ වතු කළමනාකරණ අංශය වෙත කළමනාකරණය සඳහා පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන හතරක් සහ පර්යේෂණ මධ්‍යස්ථාන හතක් පවතී. පොල් පර්යේෂණ ආයතනය සතු මුළු වතු භූමි ප්‍රමාණය අක්කර 3,148 ක් වන අතර ඉන් අක්කර 1,980 ක් පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන ද අක්කර 1,168 පර්යේෂණ මධ්‍යස්ථාන ද වේ.

වතු කළමනාකරණ අංශය භාණ්ඩාගාර අරමුදල් මත පදනම් නොවී ස්වයං මූල්‍ය පාලන අංශයක් ලෙස සතුටුදායක මට්ටමෙන් පවත්වාගෙන යනු ලබයි.

දිවයිනේ ප්‍රධාන පොල් වගාකරන ප්‍රදේශවල පොල් තවාන් සඳහා උසස් තත්ත්වයේ බීජ පොල් වර්ග ලබා දීම සඳහා ජාන සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම මෙම අංශයේ මූලික අරමුණ වේ. තවද මෙම අංශය මගින් පර්යේෂණ අංශයන්හි පර්යේෂණ කටයුතු සඳහා විවිධ තත්ත්වයන් යටතේ පහසුකම් සැපයේ. උදාහරණයක් ලෙස විවිධ පාංශු තත්ත්ව යටතේ, විවිධ කෘෂි පාරිසරික තත්ත්වයන් යටතේ විවිධ පොල් ප්‍රභේදවල වර්ධන අවධීන් යනාදියයි.තවද පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා ශ්‍රමය,ඉඩම්, ද්‍රව්‍ය ,ආරක්ෂාව හා රැකවරණය වැනි පහසුකම් වතු කළමනාකරණ අංශය විසින් සපයනු ලැබේ.

තවද, විද්‍යාඥයින් වතු කළමනාකරුවන්, පොල් වගාකරන්නන්, විශ්ව විද්‍යාල සිසුන්, කාර්මික විද්‍යාල හා පාසල් සිසුන් ද, වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා ද විවිධ වතුවල අතුරු බෝග ආදර්ශයන් පවත්වා ගැනීම තුළින් නව තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම සාර්ථකව සිදු කෙරේ.

පර්යේෂණ/ජාන සම්පත් මධ්‍යස්ථානය	මූලික අරමුණ	අක්කර ප්‍රමාණය	ප්‍රකාශ
මාකඳුර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	145	
රත්මලාගාර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	251.1	
වල්පිට පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	40	
පොත්තුකුලම පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	194	
බණ්ඩිරිප්පුව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	360.16	
මිද්දෙණිය පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	75.55	
තඹබෝව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	6.96	
අඹකැලේ ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	347.8	වන ප්‍රදේශ 828 අක්
මාදුරුඔය ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	205.1	
පල්ලම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	623	
වැලිගම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	17.02	



රූපය 1 : 2011 සිට 2020 දක්වා කාලපරිරිච්ඡේදයේ පොල් පර්යේෂණ ආයතනය සතු වගුවල පොල් ඵලදාවේ විචලනය



	Makandura	Bandirippuwa	Walpita	Rathmalagara	Poththukulama	Maduru Oya	Ambakelle	Middeniya	Pallama	Thabbowa
2019	439,850	730,192	138,433	222,145	768,505	703,923	1,377,4	146,821	840,154	43,053
2020	279,422	687,867	105,941	198,681	571,605	417,942	999,452	144,230	508,324	28,419

රූපය 2 : 2019 සහ 2020 කාපරිච්ඡේදය තුළ පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල මුළු පොල් නිෂ්පාදනය

2020 වර්ෂයේ දී සියළුම පොල් පර්යේෂණ ආයතනය සතු වතු වල මුළු පොල් ගෙඩි ඵලදාව මිලියන 3.94 කට ආසන්න විය. ප්‍රධාන වශයෙන් පොල් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කර ඇත්තේ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසිය හරහා ය.

විවිධ වතු වල නිෂ්පාදන පිරිවැය සහ ශුද්ධ විකුණුම් අනුපාතය රූපය 03 මඟින් දක්වා ඇත. පහත වගුවේ දක්වා ඇත. (2020) වතු සියල්ලම සැලකූ විට පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය එක් පොල් ගෙඩියක් සඳහා රු.38.12 ක් වූ අතර, ශුද්ධ විකුණුම් අනුපාතය රු.51.22 ක් විය. සියළු වතු වල 2020 වසරේ ශුද්ධ ලාභය රු.මිලියන 72 ක් විය.



	Makandura	Bandirippuwa	Walpita	Rathmalagara	Poththukulama	Madura Oya	Ambakelle	Middeniya	Pallama	Thabbowa
COP	36.05	28.28	34.81	59.52	20.91	28.98	26.92	41.17	48.12	32.35
NSA	48.89	38.96	42.56	35.99	43.83	49.63	66.45	47.92	52.27	43.30

රූපය 3 : පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සහ සාමාන්‍ය ශුද්ධ විකුණුම් අනුපාතය

